

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති තුමාගේ පණිවුඩය

''කියවීම මිනිසා සම්පූර්ණ කරයි'' යනුවෙන් සුප්‍රකට කියමනක් ඇතත්, වර්තමානයේ පුවත්පත් සඟරා කියවීමෙන් මිනිසා බැහැරවී සිටින බැව් අප කාටත් නොරහසකි. මක්නිසාදයත් තාක්ෂණයේ දියුණුවත් සමග ජංගම දුරකථන, මුහුණුපොත හා අනෙකුත් සමාජ ජාලා මාධ්‍ය ඔස්සේ නිරන්තරයෙන් පණිවුඩ හුවමාරු කිරීම සදහා අප බොහෝ දෙනෙක් යොමුව සිටිමයි.

කරුණු එසේ වුවත්, අද මා දකින්නේ මේ වන විට මුළුමහත් සමාජයම යම්කිසි රාමුවකට සීමාවී සිටින බවත්, තමන්ගේ අතීතය වර්තමානය හා අනාගතය පිළිබඳවත් නිවැරදි අවබෝධයක් නොමැති චාරිත්‍ර වාරිත්‍ර වලින් තොර, සංස්කෘතිය, (සභ්‍යත්වය) පිරිහී ගොස් ඇති අනවශ්‍ය ප්‍රශ්න සමුදායකින් මනස් පුරවාගත් මිනිසුන් සමූහයකි.

මෙවන් අවස්ථාවක, ''කූගර්'' වැනි සඟරාවක් නිර්මාණය කර එය සෙබලුන් අතර බෙදාහැරීමෙන් මා ඉහත සදහන් කල සමාජ පරිහානිය යම්තාක් දුරට හෝ වළකාලීමේ අරමුණින් හිටපු රෙජිමේන්තු අධිපති විසින් සෙබලුන්ගේ කියවීම හා සාමාන්‍ය දැනුම වර්ධනය කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ගෙන ඇති පියවර මා මේ අවස්ථාවේදී ගෞරව භක්තියෙන් යුතුව සිහිපත් කරන අතර ඒ සඳහා මාගේ හෘදයාංගම ස්තූතිය පුද කර සිටිමි.

එබැවින් මා වර්තමාන රෙජිමේන්තු අධිපති වශයෙන්, සිංහ පවුලේ සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ මෙම ත්‍රෛයිමාසික සඟරාව නිවැරදිව පරිශීලනය කර එය තුලින් අප රෙජිමේන්තුවේ රට පුරා විසිර පවතින අනෙකුත් සාමාජික සිංහ පවුල් පිළිබදවත් සමස්ථයක් වශයෙන් අප සිංහ රෙජිමේන්තුව පිළිබදවත් එහි නවතමයෙන් සිදුවන සංවර්ධන ක්‍රියාදාමයන්, රාජකාරීන් මෙන්ම රෙජිමේන්තුව විසින් අත්පත්කරගන්නා ජයග්‍රහණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමය. තවද තම රෙජිමේන්තුවේ අභිමානය ඔප්නැංවීමේ අරමුණින් සිදුකෙරෙන මෙම කාර්ය සදහා සැමගේ සහභාගීත්වයද මෙම සඟරාවට කෙරෙන පශස්ත දායකත්වයයි.

අවසාන වශයෙන් මාතෘභූමියේ ඒකීයභාවය, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීම උදෙසා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ හා ඉටු කරනු ලබන සියළුම යුධ හමුදා සාමාජිකයන්ටත් සිවිල් සේවක මහතුන්ටත්, ඔවුන්ගේ පවුල් වල සැමටත්, සෞභාග්‍යමත්, සුභ නව වසරක් වේවායි මා ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

එම් මුදන්නායක ආර්ඩබ්ලිව්පී යූඑස්පී
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා



# මේජර් ජෙනරාල් එම් කේ ඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ විශ්‍රාම යාම











ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විශ්‍රාම යාම වෙනුවෙන් සම්මාන පෙළපාලියක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විනි.

වසර 35 කට නොඅඩු සේවා කාලයක් සපුරමින් තම මාතෘ භූමියට අනුපමේය මෙහෙයක් ඉටුකල මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් යුධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම නිමිති කොටගෙන 2019 ඔක්තෝබර් මස 25 වන දින අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන පෙළපාලියක්, සියළු නිළ තේපැන් සංග්‍රහයක් හා නිළධාරි නිවස්න රාත්‍රි භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් අජිත් පල්ලාවෙල ආර්ඩබ්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන් විසින් විශ්‍රාම යාමට නියමිත මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් පිළිගනු ලැබූ අතර පසුව වර්ණවත් සම්මාන පෙළපාලියක් ලබාදීමෙන් හරසරට පත්කරන ලදී. අනතුරුව රණවිරු ස්මාරකය වෙත පැමිණි එම ජ්‍යෙෂ්ඨ නිලධාරී මියගිය රණවිරුවන් සිහි කරමින් පුෂ්පෝපහාර දක්වන ලදී. සිංහ රෙජිමේන්තු පුස්ථකාලය ඉදිරිපිට සිදුකල රුක් රෝපණයෙන් අනතුරුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් සියළු නිළ තේපැන් සංග්‍රහයක් බලලත් නිළධාරි සහ සැරයන් නිවස්නයේදී පැවැත්වූ අතර නිළධාරී නිවස්නය මගින් රාත්‍රි භෝජන සංග්‍රහයක් සුදානම් කර තිබිණි.

එම ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය අතරතුරදී හටපිරිස් ඇමතීමක්ද සිදුකල අතර තම රාජකාරි කාලසීමාව තුලදී නන් අයුරින් සහයෝගය ලබාදුන් සියළුම නිළධාරින් සහ සෙසුනිළයින් වෙත තම හෘදයාංගම ස්තූතිය ද පුදකරන ලදී. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සියළුම නිළධාරින් නියෝජනය වන පරිදි නිළධාරී නිවස්නය වෙතින් සුදානම් කර තිබූ රාත්‍රි භෝජන සංග්‍රහයක් සදහා සිංහ රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිළධාරීන් සහ ඔවුන්ගේ බිරින්ඳෑවරුන්ද සහභාගී විය.

## රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නව රෙජිමේන්තු අධිපතිගේ රාජකාරීන් ආරම්භ කිරීම
















ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 12 වන රෙජිමේන්තු අධිපති වශයෙන් මේජර් ජෙනරාල් මනෝජ් මුදන්නායක ආර්ඩබ්ලිව්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් සම්ප්‍රදායානුකූලව වැඩ භාර ගැනීමේ උත්සවය වර්ෂ 2019 නොවැම්බර් මස 04 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය - අඹේපුස්ස හිදී පැවැත්විණි.

එහිදී නව රෙජිමේන්තු අධිපති වෙත වර්ණවත් සම්මාන පෙළපාලියක් හා කදවුරු මුරයක් පිරිනමන ලද අතර විශ්‍රාම ලබා සිටින හිටපු රෙජිමේන්තු අධිපතිවරුන්, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විශ්‍රාමික ජ්‍යෙකොනොනීන්, සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් හා සෙසුනිලයින් එම උත්සවය සඳහා සහභාගී විය.

නව රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරීන් ඇරඹීමත් සමග රට ජාතිය ආරක්ෂා කිරීම සඳහා තම ජීවිත පරිත්‍යාග කල ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු රණවිරුවන් සිහි කරනු වස් රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර උත්සවයක් පවත්වන ලදී.

ඉන්පසුව රෙජිමේන්තු අධිපති, බලලත් නිළධාරී සහ සැරයන් නිවස්නයේ සුදානම් කරන ලද තේ පැන් සංග්‍රහයට සහභාගී විය.

මෙම උත්සවයේදී නව රෙජිමේන්තු අධිපති විසින් සියලු නිළයන් අමතන ලද අතර එහිදී වසර 63 ක පෞඪ ඉතිහාසයකට උරුකම් කියන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව අභිමානවත් රණවිරුවන්ගෙන් සමන්විත අතර ඔවුන් මව්බිම නිදහස් කරන ලද මානුෂීය මෙහෙයුමේදි මෙන්ම ඉන් අනතුරුවද කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකල බව සඳහන් කල අතර වෘත්තීය නිපුණතාව තුලින් සාර්ථකත්වය අත්පත් කරගත හැකි බවද වැදුරටත් පවසන ලදී.


එම උත්සවයේ අවසාන අංගය ලෙස නිළධාරී නිවස්නයේදී පැවති දිවා ආහාරය සඳහා සේවයේ නියුතු මෙන්ම විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිළධාරීන් සහ එම භාර්යාවන් සහභාගී විය.

සාම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව ආගමික චාරිත්‍ර වාරිත්‍ර මධ්‍යයේ නව රෙජිමේන්තු අධිපති ලෙස වැඩ ඇරඹන ලද නව රෙජිමේන්තු අධිපතිතුමා එය සනිටුහන් කිරීම වස් රුක් රෝපණයක්ද සිදු කරන ලදී.













# මේජර් ජෙනරාල් කපිල බංඩාර උදළුපොල ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ විශ්‍රාම යාම





වසර 34 කට නොඅඩු සේවා කාලයක් සපුරමින් මාතෘ භූමියට අනුපමේය මෙහෙයක් ඉටුකල මේජර් ජෙනරාල් කපිල බංඩාර උදළුපොල ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම නිමිති කොටගෙන සම්මාන පෙළපාලියක් 2019 නොවැම්බර් මස 22 වන දින අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒ පී පල්ලාවෙල ආර්ඩබ්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් විසින් විශ්‍රාම යාමට නියමිත මේජර් ජෙනරාල් කපිල බංඩාර උදළුපොල ආර්එස්පී ජ්‍යෂ්ඨ නිළධාරීතුමන් මහත් හරසරින් පිළිගනු ලැබීමෙන් අනතුරුව වර්ණවත් සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි. අනතුරුව රණවිරු ස්මාරකය වෙත පැමිණි එම ජ්‍යෂ්ඨ නිළධාරී මියගිය රණවිරුවන් සිහි කරමින් පුෂ්පෝපහාර දක්වා සියළු නිළ තේපැන් සංග්‍රහයකට සහභාගී වු අතර නිළධාරී නිවස්නය මගින් රාත්‍රි භෝජන සංග්‍රහයක්ද සුදානම් කර තිබිණි.



එම ජ්‍යෂ්ඨ නිලධාරීතුමන් සම්මාන පෙළපාලිය අතරතුරදී භටපිරිස් ඇමතීමක් සිදුකල අතර තම රාජකාරි කාලසීමාව තුළදී නන් අයුරින් සහයෝගය ලබාදුන් සියළුම නිළධාරීන් සහ සෙසුනිළයින් වෙත තම හෘදයාංගම ස්තූතිය ද පුදකරන ලදි. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සියළුම නිළධාරීන් නියෝජනය වන පරිද්දි නිළධාරී නිවස්නය වෙතින් සුදානම් කර තිබු රාත්‍රි භෝජන සංග්‍රහය සඳහා සිංහ රෙජිමේන්තුවේ ජ්‍යෂ්ඨ නිළධාරීන්, නිළධාරීන් සහ ඔවුන්ගේ බිරින්ඳෑවරුන්ද සහභාගී විය.







රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා



# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපතිතුමාගේ ඒකක සංචාරය





ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අධිපති වන මේජර් ජෙනරාල් මනෝජ් මුදන්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් තම ප්‍රථම ඒකක සංචාරය වශයෙන් 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව 2019 දෙසැම්බර් මස 05 වන දින සංචාරය කල අතර එහි දෙවන අධියර වශයෙන් 2019 දෙසැම්බර් මස 06 වන දින 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සංචාරය කරන ලදි.

කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීමෙන් අනතුරුව එම ඒකකයන්හි අණදෙන නිළධාරීවරුන් විසින් රෙජිමේන්තු අධිපති මහත් හරසරින් පිළිගන්නා ලදි.

පසුව තම ඒකක සංචාරය සනිටුහන් කරමින් රුක්රෝපණයක් සමූහ ඡායාරූපයක පෙනී සිටීමක් සහ භට පිරිස් ඇමතීමක් රෙජිමේන්තු අධිපතිතුමා විසින් සිදු කරන ලදි. ඒකක සංචාරයේ අවසන් අංගය වශයෙන් නිළධාරී නිවස්නය වෙතින් සංවිධානය කරන ලද දිවා ආහාරය සදහා ද රෙජිමේන්තු අධිපති තුමන් සහභාගී වු අතර එහිදී සමරු සටහනක්ද තබන ලදි.














# මේජර් ජෙනරාල් කේ එච් පී පී ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු සහ මේජර් ජෙනරාල් බී ත් එල් රත්නායක ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මේජර් ජෙනරාල් නිළයට උසස්වීම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සමරන ලදී





මේජර් ජෙනරාල් පාලිත ප්‍රසන්න ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු සහ මේජර් ජෙනරාල් ලලිත් රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මේජර් ජෙනරාල් නිළයට උසස්වීම නිමිත්තෙන් උත්සව මාලාවක් 2019 දෙසැම්බර් මස 07 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය-අඹේපුස්ස හිදී පැවැත්විණි.

සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් අජිත් පල්ලාවෙල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් නවතමයෙන් නිළ උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙපල ඉතා උණුසුම් ලෙස පිළිගනු ලැබූ අතර කඳවුරු සම්මාන මුරයක් හා වර්ණවත් සම්මාන පෙළපාලියක් ලබාදීමෙන් මහත් හරසරට පත්කරන ලදි. අනතුරුව රණවිරු ස්මාරකය වෙත පැමිණි එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මියගිය රණවිරුවන් සිහි කරමින් පුෂ්පෝපහාර දක්වන ලදී.

පසුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙනුවෙන් සියළු නිළ තේ පැන් සංග්‍රහයක් බනි සහ සැරයන් නිවස්නයේදී පැවැත්වූ අතර නිළධාරී නිවස්නය මගින් ප්‍රනීත දිවා භෝජන සංග්‍රහයක් සුදානම් කර තිබිණි.







# මධ්‍යම පරිසර අධිකාරියේ සිට නව යුද්ධ හමුදා මූලස්ථානය වෙත පැමිණෙන මාර්ගය දෙපස සිදුකල රුක් රෝපණ වැඩසටහන ස▯හා රෙජිමේන්තු අධිපතිතුමන් සහභාගී විය"

ශ්‍රී ලංකා යුද්ධ හමුදාපතිතුමාගේ සංකල්පයකට අනුව 2019 වර්ෂයේ යුද්ධ හමුදා මුලස්ථානය මගින් පවත්වනු ලබන නත්තල් උත්සවයට සමගාමීව නව යුද්ධ හමුදා මුලස්ථානය වෙත මධ්‍යම පරිසර අධිකාරිය දෙසින් පැමිණෙන පිවිසුම් මාර්ග යේ සිට නැගෙනහිර පිවිසුම දක්වා මාර්ගය දෙපස මීටර් 1700 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි විවිධ වර්ණයන්ගෙන් යුත් අරලිය පැල රෝපණය කිරීමක් 2019 දෙසැම්බර් මස 23 වන දින සිදුකරන ලදී.

මෙම රුක් රෝපණ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති වන මේජර් ජෙනරාල් මනෝජ් මුදන්නායක ආර්ඩබ්ලිව්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් සහභාගී වූ අතර එතුමන් විසින් එහිදී විවිධ වර්ණයන්ගෙන් යුත් අරලිය පැල 06 ක් රෝපණය කරන ලදී.







# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු 20 වන රෙජිමේන්තු සැරයන් මේජර් විශ්‍රාම යාම

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා











ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 20 වන රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් රාජකාරි කරනු ලැබූ සෙ/363098 බනි 1 එම්ජී සමරනායක යූඑස්පී යන බලලත් නිළධාරී විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් සම්මාන පෙළපාලියක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි

ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවේ වසර 22 කට වඩා වැඩි කාලයක් සපුරමින් තම මාතෘ භූමියට අනුපමේය මෙහෙයක් ඉටුකල බලලත් නිළධාරී 1 එම්ජී සමරනායක යූඑස්පී යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම නිමිතිකොටගෙන 2020 ජනවාරි මස 09 වන දින සම්මාන පෙළපාලියක් කොනොනි භෝජනාගාරයේ සියළු සෙසුනිළ තේ පැන් සංග්‍රහයක් හා රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන මාණ්ඩලික නිළධාරී 1 ලුතිතන් කර්නල් ඩීඑස් ජයවර්ධන ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ සහභාගිත්වයෙන් බලලත් නිළධාරී/සැරයන් නිවස්නයේ රාත්‍රි භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදි.

## 21 වන රෙජිමේන්තු සැරයන් මේජර් තනතුරේ රාජකාරි භාර ගැනීම





සෙ/364202 බනි 1 එච්එම්පීඑස් නවරත්න යූඑස්පී 2020 ජනවාරි 09 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ 21 වන රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස වැඩ භාර ගත්තේය.

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමය විසින් රෙජිමේන්තු අධිපතිතුමා පිළිගැනීමේ උත්සවය

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ කාරක සභාවක් එම සංගමයේ ගරු සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ආර්ඩීඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ගේ ප්‍රධානත්වයෙන් 2019 දෙසැම්බර් මස 08 වන දින 0830 පැයට අඹේපුස්ස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

මෙම රැස්වීමේ ප්‍රධානම අරමුණ වූයේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නව රෙජිමේන්තු අධිපති වන මේජර් ජෙනරාල් එම් මුදන්නායක ආර්ඩබ්ලිව්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන් පිළිගෙන එතුමා හට ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ ප්‍රධාන අනුශාසක ධූරය පිරිනැමීමයි.

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ ගරු සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ආර්ඩීඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී විසින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නව රෙජිමේන්තු අධිපති තුමා ගෞරවයෙන් පිලිගන්නා ලද අතර ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ ක්‍රියාකාරිත්වය, සාමාජිකයන්ට ලැබෙන වරප්‍රසාද, දිස්ත්‍රික් සංවිධාන, දිනෙන් දින වර්ධනය කිරීම සහ සංගමයේ තේමාව සබැඳිව දැනුවත් කරන ලදී.









# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය කඹුරුපිටිය - අභිමංසල සුව සහන නිකේතනය 2 හි රෝහල් සංචාරයක් සිදු කරන ලදී



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය වන ප්‍රියමාලි මුදන්නායක මැතිණිය 2019 දෙසැම්බර් මස 09 වන දින කඹුරුපිටිය - අභිමංසල සුව සහන නිකේතනය 2 හි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා රෝහල් සංචාරයක් සිදු කරන ලදී.

මේ සඳහා සිංහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිළධාරීන් සහ සෙසුනිළයන්ද සහභාගී විය. එහිදී නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ විනෝදාස්වාදය සඳහා කැලිප්සෝ සංගීත කණ්ඩායමේ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රණීත දිවා ආහාර වේලක්ද පිළිගන්වන ලදී.

තවද සුව සහන නිකේතනය 2 හි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා උණුවතුර බෝතල්, දඟර හීටර් සහ විදුලි ස්ත්‍රික්ක ප්‍රදානය කිරීමක්ද සිංහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය විසින් සිදු කරන ලදී.







# බළඇණි පුවත්

## 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



1956-10-01 වන දින දියතලාව එම්පිරියල් යුද්ධ හමුදා කඳවුරේදි ආරම්භ කරන ලද 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව 63 වන අභිමානවත් සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින වලාවොඩෙයි යුද්ධ හමුදා කඳවුරේදි අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. මෙහිදි ඒකක අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් එච්ඊඑස්සි හේවාවසම් ආර්එස්පි පීඑස්සී ප්‍රධානත්වයෙන් සියළු නිලධාරි/සෙසුනිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි.

තවද කණ්ඩායම් අතර පැවැත්වූ තරගවලින් ජයග්‍රහණය කරන ලද අයවලුන් හට ත්‍යාග හා සහතික පත් පිරිනැමීමක්ද සන්ධ්‍යා කාලයේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් සංගිත ප්‍රසංගයක්ද පවත්වන ලදි.



63 වන සංවත්සරයට සමගාමීව ඒකකයේ ක්‍රිඩා දක්ෂතාවයන් ඔප්නැන්වීමේ අරමුණින් අභිනවයෙන් ඉදිකළ බහුකාර්ය ගොඩනැගිල්ල සහ කායවර්ධන මධ්‍යස්ථානය ඉකුත් ඔක්තෝබර් මස 11 වන දිනට යෙදුනු සුභ මොහොතින් නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි සහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යුඑස්පි එන්ඩීයු සුරතින් විවෘත කිරීම සිදු කරන ලද අතර මේ සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින් විශාල පිරිසක්ද සහභාගිවන ලදි.



නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි සහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කෙඩී පෙරේරා ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යුඑස්පි එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විශ්‍රාම ගැනීම නිමිත්තෙන් ඔක්තොබර් 17 වන දින 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේතුවේ සංචාරය කල අතර කිළිනොච්චිය, යාපනය, වන්නි, මුලතිවු ආරක්ෂක සේනා මුලස්ථානයන්ට අයත් සියළුම ශ්‍රිලංසිරෙ ඒකකවල භට පිරිස් ඇමතීම සිදුකරන ලදි. එහිදි ඒකක වල සිටින අණදෙන නිලධාරි වරුන් විසින් රෙජිමේන්තු අධිපති තුමන් වෙත සමරු තිළිණ ප්‍රධානය කල අතර සියළුම නිලයින් සමග දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදි.



2019 වර්ෂයේ අපොස සා/පෙළ විභාගයට පෙනිසිටීමට නියමිත සිසු සිසුවියන් සඳහා 2019-11-09 වන දින සම්මණ්ත්‍රණයක් පැවැත්වීම සහ සහභාගීවූ සිසුන් හට දිවා ආහාරය ලබා දිම සිදු කරන ලදි.



1ශ්‍රිලංසිරෙ ඒකක භට පිරිස් විසින් ප්‍රතිසංස්කරණය කරන ලද මෙතෝදිස්ත දේවස්ථානයේ නවපිවනම් සභාවේ අරුල්අම්මා ළමා සංවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීමේ අවස්ථාව

2019-10-27 වන දින දිපවාලි කොවිල් උත්සවය වෙනුවෙන් ඒකකයේ භට පිරිස් සඳහා සහ බළප්‍රදේශයට අයත් සිවිල් වැසියන් සඳහා සෙත් පතා පරන්තන් නාගතම්බිරාන් කෝවිලේදි පූජාවක් පැවැත්වීම.








ඌරියන් ග්‍රාම නිලධාරි වසමෙහි පදිංචි අඩු ආදායම්ලාභි පවුල් 150 ගේ ජීවන තත්වය නගාසිටුවීමේ අරමුණින් කොස්, අඹ, ඇතුළු ආර්ථික වටිනාකමකින් යුත් පැළ 1800 ක් 2019-11-23 වන දින සිවිල් වැසියන් වෙත බෙදාදෙන ලදි.

# 4 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

4 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



2019.10.01 වන දිනට යෙදී තිබූ ලෝක වැඩිහිටි දිනය වෙනුවෙන් 551 බළසේනා මුලස්ථානයේ බළසේනාධිපති තුමන්ගේ මග පෙන්වීම මත මෙම ඒකක බලප්‍රෙද්ශයේ තෝරාගත් සිවිල් වැසියන් පිරිසකට ඒකක අණදෙණ නිළධාරි ඇතුලු සියලු නිලයින්ගේ ධන පරිත්‍යාගයෙන් හා සහභාගිත්වයෙන් වියළි සළාක මල්ලක් බැගින් ප්‍රදානය කරන ලදි.



2019.10.10 වන දිනට යෙදි තිබු 70 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව ඒකක අණදෙන නිළධාරි විසින් ඒකක ධජය ඔසවා සියළු නිළධාරි/සෙසුනිළයින් වෙත යුධ හමුදාපතිගේ පණිවිඩය ප්‍රකාශයට පත්කරන ලදී.



2019.11.12 දිනට යෙදි තිබු ඉල් පුර පසලොස්වක පොහොය දිනය නිමිත්තෙන් මෙම ඒකකය තුල 551 බසේමු හා 16 (සෙවි) ශ්‍රිලපාහ ඒකක නිළධාරි සෙසු නිළයින් රැසකගේ සහභාගිත්වයෙන් කහටග ස්දිගිලිය රාජ මහා විහාරයෙන් ස්වාමීන් වහන්සේ නමක් වඩමවා බෝධි පූජා පිංකමක් පවත්වන ලදී.

2019.11.28 වන දින මෙම ඒකක 34 වන බළඇණි සංවත්සර දිනයට සමගාමීව නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලීය ආචාර්ය මණ්ඩලයේ සිසු දරු දැරියන්ගේ හා ඒකක නිළධාරි/සෙසුනිළයින්ගේ සහාභාගිත්වයෙන් විදුහල් භූමියෙහි රුක්රෝපණ වැඩ සටහනක් පවත්වන ලදි.









මෙම ඒකක බප්‍රදේශයේ ජෙ/360 කරණවායි නැගෙනහිර පදිංචි ජෙගනාදන් මෙයුරි නැමැති අඩුආදායම්ලාභි කාන්තාව හට කුමාර් වීරසූරිය නැමැති දානපතියෙකුගේ ධන පරිත්‍යාගෙන් යුතුව ආසේමු(යා) ආඥාපති මේජර් ජෙනරාල් පිර් වනිගසූරිය VSV USP ndu USA CGSC යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ සහ 55 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ ndc, IG යන ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ පුර්ණ අධික්ෂණය මත 551 බළසේනාධිපති කර්නල් පිපිඒ පෙරේරා psc යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ මෙහෙයවිම යටතේ 4 වන බළඇණිය ශ්‍රිලංකා සිංහ රේජිමේන්තුවේ අණදෙන නිළධාරි මේජර් ඩිඩිපිඑස් දසනායක ආර්ඩබ්ලිව්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරි සහ ඒකකයේ අනෙකුත් නිළධාරි/සෙසු නිළයින්ගේ ශ්‍රමදායකත්වය මත මෙම නිවස සාදා 2019.12.17 වන දින ආසේමු(යා) ආඥාපති තුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව සුභමොහොතින් විවෘත කර අදාල නිවස හිමි කාන්තාව වෙත යතුර භාරදෙන ලදි. මේ සඳහා බළප්‍රදේශයේ ප්‍රභුවරුන්, ආගමික පූජකවරුන් සහ සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගි වන ලදි.

# 6 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

6 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







**වගා ළිදකට වැටී සිටි කාන්තාවක් 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් බේරා ගැනීම**

විශ්වමඩු ප්‍රදේශයේ තොට්ටිඅඩි ගම්මානයේ ස්ථානගත මෙම ඒකකයට ආසන්න නිවසක පදිංචිව සිටි පත්මනාදන් කේමලතා නම් දමිළ කාන්තාව 2019.11.14 දින අඩි 40 ක් පමණ ගැඹුරු ලිදකට වැටී සිටියදි වහාම ක්‍රියාත්මක වු එවකට මෙම ඒකක වැ:බ අණදෙන නිළධාරි මේජර් යු බී කේ සුභසිංහ ආර්ඩබ්පි ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරි තුමාගේ උපදෙස් පරිදි හදිසි ආපදා කණ්ඩයේ භට පිරිස් එම ස්ථානයට ගොස් ඇයගේ ජිවිතය බේරා ගැනිමට කටයුතු සිදුකරන ලදි.

පසුගිය දින තුළ පැවති අයහපත් කාළගුණික තත්වය හේතුවෙන් ගංවතුරෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් මෙම ඒකක වැ:බ අණදෙන නිළධාරිගේ උපදෙස් පරිදි භට පිරිස් එම ස්ථානයන්ට ගොස් රාජ්‍ය ආයතන වල සම්බන්ධතාවයෙන් යුතුව අවතැන් වු ජනතාවට සහන සැලසීමට කටයුතු සිදුකරන ලදි.







# 7 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



යුද්ධ හමුදා සාමාජිකයින් විනය විරෝධි ක්‍රියාවන්ට පෙළඹීම, විවිධ අවස්ථාවන් වලදි අනතුරු වලට ලක්වීම වලක්වා ගැනීම, මත්ද්‍රව්‍ය වලට යොමුවීමේ ප්‍රවණතාවය අවම කිරිම සහ සියදිවි හානි කර ගැනීම සැබැදිව දැනුවත් කිරිම මෙන්ම යුද්ධ හමුදාවේ විනය පවත්වා ගැනීමේ අරමුණින් ආරක්ෂක සේනා මුලස්ථානය වන්නි හි උපදෙස් මත ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඊවීයුවී අමරසේකර ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අධික්ෂණය යටතේ ඒකකයේ සෙබළුන්ගේ සුභසිද්ධිය උදෙසා දේශණයක් 2019.12.12 වන දින ඒකක දේශණ ශාලාවේදි පවත්වනු ලැබීය. මේ සදහා බෝගස්වැව පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති සහ 56 වන සේනාංකයේ විනයාරක්ෂක නියෝජිතයින් විසින් දේශණය පවත්වන ලදි.



7 වන බලඇණිය ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඊවීයුවී අමරසේකර ආර්එස්පි ජ්‍යෙෂ්ඨ නිළධාරි තුමන්ගේ උදාරතර සංකල්පයකට අනුව බල පදේශයේ සිවිල් වැසියන්ගේ සුභ සාධනය උදෙසා වව්නියාව දිස්ත්‍රික්කයේ මාමඩුව ප්‍රාදේශිය රෝහල සුද්ද පවිත්‍ර කිරිමේ වැඩසටහනක් 2019.10.27 වන දින සිදු කරනු ලැබීය.

වව්නියාව බෝගස්වැව ප්‍රදේශයේ ස්ථානගතව සිටින 7 වන බල ඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි තුමන් වන ලුතිතන් කර්නල් ඊවීයුවී අමරසේකර ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අරමුණකට අනුව එකකයේ සෙබළුන්ගේ සුහදත්වය වර්ධනය කිරිමේ අරමුණ පෙරදැරිව 2019.11.16 වන දින ක්‍රිකට් තරගාවලියක් පවත්වනු ලැබීය. ඒ සදහා ඒකකයේ අණදෙන නිළධාරි තුමා,දෙවන අණදෙන නිළධාරි තුමන් ඇතුළු නිලධාරින් සහ රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලුව සියලු සෙසුනිළයින් සහභාගි වන ලදී ඒකකයේ සියලු කණ්ඩායම් සමග තරග සංවිධානය කර තිබු අතර, අණදෙන නිලධාරි තුමා ප්‍රමුඛ අණ සහ පාලන කණ්ඩායම ජයග්‍රහණය කරන ලදී.









7 වන ශ්‍රි ලංකා සිංහ රෙජිමේන්තු බල ප්‍රදේශයට අයත් වව්නියාව දිස්ත්‍රික්කයේ පිරප්පන්මඩුව ගම්මානයේ පිහිටා ඇති ශ්‍රි පඤ්ඤාණන්ද විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන කඨින පිංකම උත්කර්ෂවත් අන්දමින් පැවැත්විම සදහා 7 වන බලඇණිය ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ඊවීයුවී අමරසේකර ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ පුර්ණ අධික්ෂණය යටතේ සෙබළුන්ගේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදි. මෙහිදි අභිනවයෙන් ඉදිකරන ලද ආවාසගෙය 563 බලසේනා මුලස්ථානයේ බළසේනාධිපති සහ එකක අණදෙන නිළධාරි තුමන්ලාගේ සුරතින් සඟ සතු කරන ලදි.



පරිසර සතිය නිමිත්තෙන් අපගේ වන සම්පත රැක ගැනීම වස් 7 වන බලඇණිය ශ්‍රි ලංකා සිංහ රෙජිමේන්තුවේ සෙබළුන් විසින් 2019.10.26 වන දින රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබීය.



7 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





7 වන බල ඇණිය ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයේ පෙර පාසල් ළමුන්ගේ ගුණ ඥාන සහ කුසලතාවයන් වර්ධනය සඳහා අත්වැලක් වෙමින් වව්නියාව බෝගස්වැව 11 ගම්මානයේ දිලෙන තරු පෙර පාසලේ දරු දැරියන් උදෙසා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් 2019.12.09 වන දින ඒකක අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ඊඒයූඒ අමරසේකර ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. මේ සඳහා පාසල් උපකරණ එවකට 7 වන බලඇණිය ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි වශයෙන් රාජකාරි කල දැනට 65 වන සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් රාජකාරි කරන මේජර් ජෙනරාල් කේ ඒ ඩබ් කුමාරප්පෙරුම යූඑස්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරි තුමන් විසින් පරිත්‍යාග කරන ලදි.

7 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



7 වන බලඇණිය ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තුව ස්ථානගතවී සිටින බෝගස්වැව ප්‍රදේශයේ නැවත පදිංචි කිරීම් සිදුකරන ලද ජනතාවගේ ජන ජිවිතය නගා සිටුවීම සහ සිවිල් ජනතාව අතර, සුහදත්වය වර්ධනය කිරීම අරමුණ කර ගනිමින් ශ්‍රී ලංකා හදබිම් අධිකාරිය වෙතින් ලබාදෙනු ලබන කොල පැල 650 ක ප්‍රමාණයක් ඒකකයේ අණදෙන නිළධාරි ඊඒයූඒ අමරසේකර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි පූර්ණ අධීක්ෂණය යටතේ නන්දිමිත්‍රගම සහ සැළලිහිණිගම යන ගම්මාන වල තොර ගන්නා ලද පවුල් 325 ක් සඳහා කොස් පැල බෙදාදීමේ වැඩසටහනක් 2019.10.03 වන දින 56 සේනාංකාධිපති තුමාගේ සහ 563 වන බලසේනාධිපති තුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි.



ආරක්ෂක සේනා මුලස්ථාන වන්නි නව ආඥාපති ලෙස වැඩ භාරගත් මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩියු පීඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019.11.30 වන දින 7 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු වෙත නිරික්ෂණ චාරිකාවක් සඳහා පැමිණියේය. ඒකක අණදෙන නිලධාරි වන ලුතිතන් කර්නල් ඊඒයූඒ අමරසේකර ආර්එස්පි විසින් අඥාපති තුමන් පිළිගැනිමෙන් පසු ආඥාපති තුමන් විසින් කඳවුරු සංචාරය සිහිකිරීම වස් කඳවුරු භූමියේ සුදු හඳුන් පැලයක්ද රෝපණය කරන ලදි. මෙම අවස්ථාව සඳහා 56 සේනාංකයේ සේනාංකාධිපති,563 බලසේනා මුලස්ථානයේ බලසේනාධිපති, ඒකක අණදෙන නිළධාරින් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිළධාරින් පිරිසක් සහභාගි විය.





# 8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 27 වන සංවත්සරය හා ඒකක අණදෙන නිළධාරිගේ නිළ උසස්වීම සමරනු වස් අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ජේ ආර් බී ඩබ්ලිව් පල්ලේකුඹුර ජ්‍යෙෂ්ඨ නිළධාරී වෙත 2019.10.16 දින සම්මාන පෙළපාලියක් පවත්වන ලදි.

ඉන් අනතුරුව අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ජේ ආර් බී ඩබ්ලිව් පල්ලේකුඹුර ජ්‍යෙෂ්ඨ නිළධාරී හා සියළු නිලයන් සමග දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම හා අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ජේ ආර් බී ඩබ්ලිව් පල්ලේකුඹුර ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් පැලයක් රෝපණය කිරීම සිදු කරන ලදි.

තවද, 8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 27 වන සංවත්සරය වෙනුවෙන් සංගීත ප්‍රසංගයක් පවත්වන ලදි.

8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







# 9 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

9 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





2019.10.06 වන දින ආසේමු (ම) ආඥාපති මේජර් ජෙනරල් ජීජේවල් වඩුගේ ආර්ඩබ්පි ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ කඳවුරු සංචාරය සිදු කරන ලදි. මෙහදී පිරිස් ඇමතීමක් හා අණදෙන නිලධාරි නව කාර්යාලය විවෘත කරන ලදි.





2019.10.18 වන දින රෙජි අධිපති මේජර් ජෙනරල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ කඳවුරු සංචාරය නිමිත්තෙන් පැවති කඳවුරු මුරය, අඹ පැලයක් රෝපණය කිරීම, භට පිරිස් ඇමතීම සහ සියලු නිළ දිවා භෝජන සංග්‍රහය පවත් වන ලදී.





2019.12.16 වන දින 14 වන අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ආර්ආර්කේආර් උඩගේ (නි/64116) යන ජ්‍යෂ්ඨ නිළධාරි තුමන්ගේ තනතුරෙන් නික්මයෑම වෙනුවෙන් කඳවුරු මුරය, සම්මාන පෙළපාලිය, භට පිරිස් ඇමතීම හා සියළු නිළ තේ පැන් සංග්‍රහය පවත්වන ලදි.

# 12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව









12 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 12 වන බළඇණි දිනය 2019.10.22 වන දිනට යෙදී තිබූ අතර ඒ වෙනුවෙන් සේවයේ යෙදී සිටින සහ මියගිය රණවිරුවන් වෙනුවෙන් සෙත්පතා කතරගම දේවාලයේ දේව මෙහෙයක් පැවැත්වීම, වරු පිරිත් සජ්ඣායනාවක් පැවැත්වීම ස්වාමීන් වහන්සේලා 12 නමක් වෙනුවෙන් දානය පිළිගැන්වීම, ලේ දන්දීමේ වැඩසටනක් පැවැත්වීම සහ බළඇණි දිනයට සමගාමීව අණදෙන නිළධාරී වෙත සම්මාන පෙළපාලියක් පැවැත්වීම, සියළු නිළ භෝජන සංග්‍රයක් පැවැත්වීම සහ කණ්ඩාම් අතර සහයෝගිතාවය වර්ධනය කිරීම වෙනුවෙන් කඹ ඇදීමේ තරගාවලියක් සහ ක්‍රිකට් තරගාවලියක් පවත්වමින් බළඇණි දිනය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් අනෙකුත් උත්සව කටයුතු සිදුකරන ලදී.

**අන්තර් ඒකක පිහිණුම් තරගාවලියේ මීටර් 100 හා මීටර් 66 නිදහස් ආර ඉසව්වේ 3 වන ස්ථානය මෙම ඒකකයට අයත් සෙ/37627 ලාකෝ අජිත් කුමාර යන කොනොනි විසින් හිමිකර ගන්නා ලදි.**








12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ පරිඝණක අංශය සහ සංඥා මැදිරිය නවීකරණය කිරීමෙන් පසු වායු සමනය කර 2019.11.26 වන දින අණදෙන නිළධාරී විසින් විවෘත කරන ලදි.

# 14 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







14 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 12 වන බලඇණි සංවත්සරය ඉකුත් නොවැම්බර් මස 25 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකක අණදෙන නිළධාරි ලුතිනන් කර්නල් එස්ඩීබී දිසානායක ආර්ඩබ්පි යුඑස්පී පිඑස්සී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පැවැත්විණි. එහිදි අණදෙන නිළධාරි වෙත කදවුරු සම්මාන මුරයක් පිරිනැමීමද සිදු කරන ලදි. ඒකකයේ නිළධාරි හා සෙසුනිළයින් හට සංවිධානය කරනු ලැබු සියලු නිළ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම සහ එදිනම සන්ධ්‍යාවේ ක්‍රියාන්විතයේදි දිවිපිදු රණවිරුවන් හට පුණ්‍යානුමෝදනා සිදුකිරීම හා ක්‍රියාන්විතයේදි තුවාල ලැබූවන් හා දැනට සේවයේ යෙදි සිටින නිළධාරි, සෙසුනිලයින් හට ආශිර්වාද පතා බෝධිපුජා පිංකමක් පැවැත්විණි.

14 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

## 64 වන සේනාංකයේ 11 වන සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කරනු ලැබු දින 4 ක් පුරා පැවැති අන්තර් ඒකක වොලිබෝල් තරගාවලියේදි අනුශූරතාව ලබාගැනීමට 14 වන බළඇණිය ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම සමත් විය.



# 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ඒඒඩීඑස් ඉන්දුක යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මඟපෙන්වීමෙන් 2019.10.04 වන දින කරප්පුකුට්ටි ප්‍රජාශාලාවේ වකුගඩු හා දන්ත වෛද්‍ය සායනයක් ඉතා සාර්ථකව පවත්වන ලදි. එහි විශේෂ ආරාධිත අමුත්තා ලෙස පැමිණි 56 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්පී සෙනවිරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ (නි/60580) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ හා 561 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක (නි/62110) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සහභාගිත්වයෙන් වව්නියාව දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය කණ්ඩායමක් විසින් මෙම සායනය පවත්වන ලද අතර එම අවස්ථාවට පැමිණි 56 සේනාංකාධිපති විසින් ගැබිණි මව්වරුන් සඳහා විශේෂ වියළි සළාක මළු ප්‍රදානය කිරීමක් සිදුකරන ලදි.



16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු භූමිය තුළ ස්ථාපනය කරන ලද ඔසු උයන 2019.11.08 වන දින මෙම ඒකක ප්‍රථම කඳවුරු සංචාරය සඳහා පැමිණි 56 සේනාංකයේ නව සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ඩබ්ලිව්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්පී ආර්එස්පී (නි/60738) යන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් විවෘත කරන ලද අතර එම අවස්ථාවට 561 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක (නි/62110) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීද සහභාගී විය.



ආසේමු (ව) බලප්‍රදේශයට අයත් නෙදුන්කේනි ප්‍රදේශයේ මාරඉලුප්පායි ග්‍රාමසේවා වසමේ කච්චිකුඩි වැවෙහි බැම්ම අධික වර්ෂාපතනය හේතුවෙන් කැඩීයාමේ අවදානමට ලක්වීම නිසා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු නිලධාරීගේ ඉල්ලීම පරිදි 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් 2019.12.07 වන දින එහි අවට ජීවත්වන සිවිල් ජනතාවට හා ඔවුන්ගේ වගා කටයුතුවලට ආපදාවක් නොවන පරිදි වැවෙහි පිට වානෙන් ජලය මුදාහැරීමට කටයුතු කොට පැවති අවදානම් තත්වය අවම කරන ලදි.



16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු භූමිය තුල ස්ථාපිත කරන ලද ජල පිරිපහදු යන්ත්‍රාගාරය 2019.11.29 වන දින මෙම ඒකකය වෙත කඳවුරු සංචාරය සඳහා පැමිණි ආසේමු (වන්නි) ආඥාපති තුමන් වන මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩියූ පීඑස්සී (නි/60544) ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් විවෘත කරන ලද අතර එම අවස්ථාවට 56 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ඩබ්ලිව්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්පී ආර්එස්පී (නි/60738) සහ 561 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක (නි/62110) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගී විය.

# 20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

20 වන බළඇණිය ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි මේජර් සීඑස් සේරසිංහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ ප්‍රධානත්වයෙන් 70 වන යුද්ධ හමුදා දිනය අභිමානවත් අයුරින් සමරන ලදි. උත්සවය ආරම්භ කරමින් අණදෙන නිළධාරි විසින් යුද්ධ හමුදා ධජය ඔසවන ලද අතර සියලු නිළයින් විසින් යුද්ධ හමුදා ගීතය ගායනා කිරීම, රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකිරීම වෙනුවෙන් විනාඩි 02 ක නිෂ්ශබ්ධතාවයක් පැවැත්වීම, යුද්ධ හමුදාපතිගේ පණිවුඩය කියවීම සිදුකළ අතර, රුක්රෝපණ වැඩසටහනක් ඒකකයේ සියලුම නිළධාරි හා සෙනින්ගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදි.



20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේතුවේ සිය අභිමානවත් 11 වන සංවත්සරය වෙනුවෙන් 2019 ඔක්තෝබර් මස 27 වන දින ඒකක අණදෙන නිළධාරි මේජර් සී එස් සේරසිංහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ ප්‍රධානත්වයෙන් සැමරුම් වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබුණි.



එහිදි අණදෙන නිළධාරි වෙත කඳවුරු මුරයක් පිරිනැමීම, සම්මාන පෙළපාලියක් පිරිනැමීම සහ රුක්රෝපණ වැඩසටහනක් පැවැත්වූ අතර සියළු නිළයන්ගේ සහභාගීත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි.



ඒකක අණදෙන නිළධාරි වන මේජර් සීඑස් සේරසිංහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරි සහ අනෙකුත් නිලධාරින්/සෙනීන්ගේ සහභාගීත්වයෙන් ඒකක බලප්‍රදේශයට අයත් පෙරියවලයන්කඩ්ඩු ගම්මානයේ රුක්රෝපණ ව්‍යාපෘතිය සඳහා සිවිල් වැසියන් හට මී පැළ 500 ක ප්‍රමාණයක් බෙදාදීමේ වැඩසටහනක් පවත්වන්නට යෙදුණි.



ආසේමු (ව) ආඥාපති මේජර් ජෙනරාල් ඒ එම් ආර් ධර්මසිරි එන්ඩියු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි 2019.12.02 වන දින 20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු සංචාරය සිදුකරන ලද අතර, එම අවස්ථාවේ එම ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් සෙනින්ගේ සුභ සාධන කටයුතු සොයා බැලු අතර නිළධාරින්/සෙනීන් සමග සුහද පිළිසඳරක යෙදීමටද අමතක නොකරන ලදි.



20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේතුවේ අණදෙන නිළධාරි මේජර් සී එස් සේරසිංහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ 11 වන සංවත්සරය වෙනුවෙන් 2019 ඔක්තෝබර් මස 27 වන දින බළප්‍රදේශයේ ඇති පෙරපාසල් දරු දැරියන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදි.

20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේතුවේ අණදෙන නිළධාරි මේජර් සී එස් සේරසිංහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ 11 වන සංවත්සරය වෙනුවෙන් 2019 ඔක්තෝබර් මස 27 වන දින බලප්‍රදේශයේ ඇති පෙරපාසල් දරු දැරියන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වූ අවස්ථාව මෙලෙස සනිටුහන් විය.



# 20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



2019.12.04 දින මෙම ඒකක 11 වන සංවත්සර දිනයට සමගාමීව නිලධාරී/සෙසුනිළයින් විසින් ඒකක අණදෙන නිලධාරී වෙත කදවුරු මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි.

## 21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක 68 සදහා මෙම ඒකකය නියෝජනය කරමින් සහභාගිවු කණ්ඩායමේ සෙ/372441 කෝප්‍රල් විජේසෝම කේජීඒබී යන කොනොනි එහි සෑම අතින්ම අතිශූර සෙබලා සහ හොදම ශාරීරික අභ්‍යාස සිසුවා වශයෙන් හා ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලා අංක 44 හි දෙවන ස්ථානය හිමිකර ගන්නා ලදි.



56 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් ඩබ්ඩබ්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්පි ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී හා මෙම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජේඑම්ජේ පෙරේරා යන ජ්‍යෙෂ්ඨ නිලධාරී ඇතුළු ඒකක නිලධාරීන් සෙසුනිළයින් විසින් අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් පලෙයිවාඩි ගම්මානයේ අවතැන්වු සිවිල් වැසියන්ගේ සුවදුක් විමසීම මේ අයුරින් සනිටුහන් විය.



නව ආසේමු(ව) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩ්යු පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකක කඳවුරු සංචාරයේ නිරත විම.



නවතමයෙන් ඉදිකරන ලද රෙජිමේන්තු සැරයන් මේජර් නිවස්නය රෙජිමේන්තු සැරයන් මේජර් භාරයට පත්වීම.



මෙම ඒකක බළප්‍රදේශයේ පාදයේ ආබාධයක් සහිතව සිටි ගවයෙකු හට වෛද්‍ය ප්‍රතිකාර ලබාදුන් අවස්ථාව.





2019 වර්ෂයේ අන්තර් ඒකක ක්‍රිකට් තරගාවලියේ ශුරතාවය,අන්තර් ඒකක එල්ලේ තරගාවලියේ ශුරතාවය හා අන්තර් ඒකක පාපන්දු තරගාවලියේ අනුශුරතාවය මෙම ඒකකය වෙතින් දිනාගන්නා ලදි.



# 23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



23 වන බළ ඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 11 වන රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් රාජකාරි කරනු ලැබූ සෙ/362202 බනි 1 එච්එම්පිබී නවරත්න යුඑස්පි යන බළලත් නිළධාරි ඒකකයේ රාජකාරි නිමාවෙන් පසු 2019/12/18 දින රෙම ශ්‍රිලංසිරෙ රෙජිමේන්තු සැරයන් මේජර් තනතුර සඳහා නික්ම යෑම.



23 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් පොතුවිල් හා පානම යන බලප්‍රදේශයන් වලට 2019.12.19 සහ 20 යන දෙදින තුළදී අයහපත් ගංවතුර තත්වයක් හට ගත් අතර ඒ සඳහා ඒකක සෙනින්ගේ දායකත්වය ලබා දුන් මොහොත.

ලෝක සංචාරක දිනයට සමගාමීව ආරුගම්බේ ජෙට්වින් හෝටලයේ සේවක පිරිස විසින් සංවිධානය කරන ලද පිරිසිදු කිරීමේ වැඩ සටහනක් 2019/10/27 වන දින 0800 පැයේ සිට 1230 පැය දක්වා කාලය තුල පවත් වන ලදි. එම වැඩසටහන පොතුවිල් සිට සියඹලාණ්ඩුව දක්වා ඇති මාර්ගයේ 03 කණුවේ සිට හුලංනුගේ මංසන්දිය දක්වා පැවැත්වු අතර මෙම ඒකකය වෙතින් 01×15 භට පිරිසක්ද පොතුවිල් මෙතෝදිස්ත දෙමළ විදුහලේ බාලදක්‍ෂ කණ්ඩායම, පොතුවිල් අල්/බහිරා විද්‍යාලයේ බාල දක්‍ෂ කණ්ඩායම, ලාහුගල විද්‍යාලයේ ළමුන් ඒ සදහා දායකත්වය ලබාදෙන ලදි.









# 24 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

24 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



2019 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව 59 සේමු අධික්ෂණය යටතේ මෙම ඒකකය 2019 ඔක්තොම්බර් මස 14 වන දින සිට 2019 දෙසැම්බර් මස 10 වන දින දක්වා බපුපා - නන්දිකඩාල් පුහුණු පාසල වෙතින් නිලධාරී 10 සහ සෙසුනිලයින් 310 කගේ සහභාගීත්වයෙන් බළඇණි පුහුණු පාඨමාලාව සර්ථකව හදාරන ලදී.







බළඇණි පුහුණු පාඨමාලාවෙහි කණ්ඩායම් වශයෙන් වෙහෙසකර පාගමන කි: මී 12 ක් ගමන් කරන අවස්ථාව



බළඇණි පුහුණු පාඨමාලාවෙහි ජීව වෙඩි තැබීම් සිදුකරන ලද අවස්ථාව.



බළඇණි පුහුණු පාඨමාලාවෙහි අකුණු සැර වන අභ්‍යාසය සඳහා නිලධාරි/සෙසුනිලයින් හට නියෝග ලබාදෙන ලදි.



බළඇණි පුහුණු පාඨමාලාවෙහි දක්ෂතම වෙඩික්කරු වශයෙන් ලුතිනන් ඒ එම් බි පි බි අබයකෝන් (නි/70857) යන නිලධාරි ශූරතාවය දිනාගන්නා ලදි.



බළඇණි පුහුණු පාඨමාලාවෙහි දක්ෂතම පෙළ අණදෙන්නා වශයෙන් සෙ/378217 කෝප්‍රල් දිසානායක ඩීඑම්පී යන කොනොනි ශූරතාවය දිනාගන්නා ලදි.



බළඇණි පුහුණු පාඨමාලාවෙහි දක්ෂතම ශාරීරික යෝග්‍යතාවය ඇති සෙබලා වශයෙන් සෙ/378217 ලාකෝ වීරසිංහ ආර්ඩබ්ලිව්සි යන කොනොනි ශූරතාවය දිනාගන්නා ලදි.



බළඇණි පුහුණු පාඨමාලාවෙහි අතිශූරතම සෙබලා වශයෙන් සෙ/382896 ලාකෝ සමරසිංහ පීඩීආර් යන කොනොනි ශූරතාවය දිනාගන්නා ලදි.



බළඇණි පුහුණු පාඨමාලාවෙහි දක්ෂතම කණ්ඩායම ඩි කණ්ඩායම ශූරතාවය දිනාගන්නා ලදි.

## 24 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







ආරක්ෂක සේනාංක මූලස්ථානය (මුලතිව්) යටතේ ඇති 59 සේනාංක මූලස්ථානයේ 12 වන සංවත්සරය නිමිති කොටගෙන සේනාංකය මූලස්ථානය යටතේ පාලනය වන බළසේමු/ඒකකයන් හා සේනාංකය යටතේ ඇති පුහුණු පාසලෙහි රාජකාරී කරනු ලබන භටපිරිස් සහභාගිත්වයෙන් 2019 නොවැම්බර් මස 13 15 සහ 19 යන දිනයන්හිදී 59 සේනාංක මූලස්ථාන ක්‍රීඩාංගනයේදී පැවැති පාපන්දු තරගාවලියේ සමස්ථ අනුශූරතාවය 24 වන බළඇණිය ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තුව විසින් හිමිකරගන්නා ලදි.

# මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව









රෙජිමුබ ශ්‍රීලංසිරෙ හි 20 වන සංවත්සරය නිමිත්තෙන් 2019/11/25 දින ඒකක අණදෙන නිළධාරී මේජර් ඩීඑම්එස්සී දසනායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරී හට කඳවුරු මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර සියළු නිළ තේ පැන් සංග්‍රහයක් ද පවත්වන ලදි. තවද, 2019/11/26 දින සියලු නිළ සුහද හමුව සිංහ කබානා හීදි පවත්වන ලද අතර, එහිදි බළඇණි සංවත්සරයට සමගාමීව පවත්වනු ලැබූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ශූරතාවය සහ අනු ශූරතාවය දිනා ගත් ආබාධිතවූවන් රඳවා ගැනීමේ කණ්ඩායම සහ අණ හා පාලන කණ්ඩායම වෙත කුසලාන පිරිනමන ලදි.

මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් රණක්ෂිතයට පත්ව අභිමංසල 1,2,3 හා මිහිදු සෙත් මැදුර යන ස්ථානයන්හි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීම සහ පාලන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඒකක අණදෙන නිළධාරී මේජර් ඩීඑම්එස්සී දසනායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් සංචාරයක නිරත වන ලදි.



2019 අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීමේ තරගාවලිය 2019 දෙසැම්බර් මස 14 දින සිට 22 දින දක්වා දියතලාව වෙඩි පිටියේදී පැවැත්වුනු අතර, ඒ සඳහා ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තුව නියෝජනය කරමින් නිළධාරින් 05ක් හා සෙසුනිළයින් 05 කින් සමන්විත යුධ හමුදා කණ්ඩායම් 31 ක් සහභාගී වන ලද අතර එම සියලුම කණ්ඩායම් අතුරින් හොඳම අණදෙන නිළධාරියා ලෙස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායමට අණදුන් රෙජිමේන්තු මූලස්ථාන බලඇණියේ අණදෙන නිළධාරී නි/64871 මේජර් ඩීඑම්එස්සී දසනායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරී කුසලාන හිමි කරගන්නා ලදී.











# 2 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියනු ලබන 2(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිරේන්තුවේ 63 වන සංවත්සරය අණදෙන නිලධාරී මේජර් එම්ඩබ්පී අබේසේකර ශ්‍රීලංසිරෙ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් 2019.02.10 දින ඒකක මූලස්ථානය මහනුවර කඳවුර තුළදී පවත්වන ලදි. එහිදී අණදෙන නිලධාරී හට කඳවුරු මුර පිරික්සුමක්, සම්මාන පෙළපාලියක් පැවැත්වූ අතර, මාස දෙකක් වැනි කෙටි කාලයක් තුළ සියළුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ කොනොනි සමාජ ශාලාව කොනොනින් හට පවරාදීම ද සිදුකරන ලදි. තවද, එදිනම සියළු නිල තේපැන් සංග්‍රහයක් හා සියළු නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වූ අතර, ඒකකයේ රාජකාරී කර රට දැය වෙනුවෙන් දිවිපිදූ සියළුම නිලධාරීන් හා සෙසු නිලයින් සිහිකිරීමත්, ඒකකයේ රාජකාරී කළ සහ දැනට ඒකකය සමඟ රාජකාරී කරන සියළුම නිලයින් හට ආශිර්වාද කිරීමත් වෙනුවෙන් ආගමික වැඩසටහන්ද පවත්වන ලදි.

2 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව













# 3 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

3 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව










3 වන ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තුවේ නවතමයෙන් ඉදිකරන ලද මුළුතැන්ගෙය සහ සෙසුනිළ භෝජනාගාරය මෙම ඒකක 50 වන බළඇණි සංවත්සරයට සමගාමීව 2019.10.20 වන දින මේජර් ජෙනරල් එම් කේ ඩි පෙරේරා අර්ඩබ්ලිව්පි ආර්එස්පි විඑස්වි යුඑස්පි එන්ඩියු ජ්‍යෙෂ්ඨ නිළධාරි තුමන් විසින් විවෘත කරන ලදි.

## නගරයට උයන්වතු - 2019

මධ්‍යම පලාත් සභාවේ ආණ්ඩුකාර කාර්යාලය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙ-පාර්තමේන්තුව ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ගෙවතු වගා තරගය - 2019 වර්ෂයෙ, ආරක්ෂක අංශයේ ප්‍රථම ස්ථානය 3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව දිනාගන්නා ලදි.

## ශ්‍රී පාද සමය ආරම්භ වීමට පෙර ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය මෙම ඒකක 04x50 ක හඨ පිරිසක් විසින් 2019.11.11 වන දින සුද්ධ පවිත්‍ර කරන ලදි.







2019.11.30 වන දින නුවරඑළිය වලපනේ පදියපැලැල්ල මාර්ගයේ මලපට්ටාව ප්‍රදේශයේ ග්‍රිඩ් අංක 1.50000 (හගුරන්කෙත) ග්‍රිඩ් සිතියම දරණ ස්ථානයේ නාය යාම හේතුවෙන් එක් නිවසක් සම්පූර්ණයෙන්ම විනාශවී ඇති අතර පවුල් 01 (මව, පියා, පුතා සහ ඥාති දියණියක්) සාමාජිකයින් 04 දෙනෙකු අතුරුදහන්වූ බවත්, අනතුරුව ආසේමු (ම), 11 සේමු, 112 බසේමු උපදෙස් පරිදි මෙම ඒකක අණදෙන නිළධාරි ඇතුලු 04x50 ක හඨ පිරිසක් එදිනම රාත්‍රි 2200 පැය වන විට අදාල ස්ථානය වෙත රපෝර්තු කරවා සෙවිමේ කටයුතු ආරම්භ කල අතර, 2019.12.01 වන දින ඉන් තිදෙනෙකුගේ මල සිරුරු 03 ක් (මව, පියා, සහ ඥාති දියණිය) සොයාගත් අතර, ඉතිරි මල සිරුර සොයා මෙහෙයුම් කටයුතු නොකඩවා දින 05 ක් සිදු කලද එම මළ සිරුර සොයා ගැනිමට නොහැකි විය.







# 5 වන ස්වේච්ඡා මළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





5 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ආර්ආර්එස් දෙහිගල ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ආරාධනයෙන් වත්මන් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒපී පල්ලාවෙල ආර්ඩබ්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ඒකකයේ විශ්‍රාමික හා දැනට සේවයේ නියුතු සියළුම නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් "ලයන්ස් වික්ටෝරියා විව්" නිලධාරී නිවාඩු නිකේතනය 2019 ක් වු දෙසැම්බර් මස 10 වන දින ඒකක පසු මුලස්ථානය මාබේරියතැන්න දිගන හිදි සුභ මොහොතින් විවෘත කරන ලදි.

5 වන ස්වේච්ඡා මළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







## 13 වන දකුණු අසියා මළල ක්‍රීඩා උළෙලෙහි දක්ෂතා ඇගයීම

නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 13 වන දකුණු ආසියාතික මළල ක්‍රීඩා තරඟාවලියේදී මීටර් 400 ඉසව්ව සඳහා "රිදී" පදක්කමක් සහ මීටර් 4 X 400 ඉසව්වෙන් "රන්" පදක්කමක් ලබා ගනිමින් සමස්ථ යුද හමුදාවටත්, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට සහ 5(සෙව්) ශ්‍රීලංසිරෙ ඒකක වෙතත්, අත්කර දුන් කීර්තිනාමය අගය කිරීම සඳහා ඒකක අණදෙන නිලධාරී මේජර් ආර්ආර්එස් දෙහිගල ශ්‍රීලංසිරෙ ජ්‍යෂ්ඨ නිලධාරී විසින් සෙ/5ඊ02867 ලාකෝ ගුණරත්න ඒච්එම්එල්පී හට ඔහුගේ ඉදිරි ක්‍රීඩා කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් මුල්‍යමය ත්‍යාග යක් පිළිගැන්වීමේ අවස්ථාව

# 11 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

11 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



නිලධාරීන් හා සෙසු නිලයින්ගේ ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය කිරීමේ අරමුණින් මෙම ඒකක අණදෙන නිලධාරී / දෙවන අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිළයින්ගේ දායකත්වය හා කැපවීම මගින් සංවිධානය කරනු ලැබූ පිහිනුම් තරගාවලිය 2019.12.05 හා 06 යන දිනයන්හි දී රෙජිමේන්තු මධ්‍යස්ථාන පිහිනුම් තටාකයේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්විනි.



ආසේමු (නැ) නව ආඥාපති මේජර් ජෙනරාල් HRN ප්‍රනාන්දු RSP, ndc යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සිය තනතුරේ වැඩ භාරගැනීමෙන් පසු, 2019.10.19 වන දින මෙම ඒකක සංචාරය සිදුකල අතර, එහිදි තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් පැලයක් රෝපණය කරන ලදී.

මෙම ඒකක බළප්‍රදේශය තුල නීතිවිරෝධි ක්‍රියාකාරකම් වලක්වා ගැනීමට අවස්ථාවක් වූ විට හොත්, එම ක්‍රියාකාරකම් වලක්වා ගැනීම සදහා කැරළි මර්ධන කණ්ඩයම් පුහුණුවීම් සිදුකිරීම හා සුදානම්ව තැබීම.





මෙම ඒකක කොත්මලේ අනුබණ්ඩයේ නිලධාරි/සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් නවතමයෙන් ඉදිකරනු ලැබූ බුද්ධ ප්‍රථිමා වහන්සේ ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් EUWNC ඇහැලේපොල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි ප්‍රධානත්වයෙන් නිරාවරණය කරනු ලැබූ අතර, ඒ සදහා ප්‍රදේශවාසීන්ද එක්වන ලදී.









231 බසේමුහි නව බළසේනාධිපති කර්නල් PKWWMJSBW පල්ලේකුඹුර RSP, ndc යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සිය තනතුරේ වැඩ භාර ගැනීමෙන් පසු, 2019-12-05 වන දින මෙම ඒකක සංචාරය සිදුකිරීම.



ඒකකයේ නව ප්‍රධාන සරඹ උපදේශක වශයෙන් සෙ/11ඊ01200 මා/සැරයන් මිහිර බංඩාර ආර්එම්එම් යන ජයකොඩොනි මෙම ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් EUWNC ඇහැලේපොල ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් පත් කල අවස්ථාව.

# 15 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





## මළල ක්‍රීඩා තරගාවලිය

ආසේමු(කිළි) මළල ක්‍රිඩා තරගාවලියේ කිළිනොච්චි ආරක්ෂක සේනා මුලස්ථානය යටතේ සේවයේ නියුතු නිලධාරී සහ සෙසුනිලයින් 300කට අධික මළල ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ සහභාගිත්වයෙන් 2019 ඔක්තෝම්බර් මස 20 සහ 21 යන දෙදින තුල කිළිනොච්චි මධ්‍ය මහා විද්‍යාලීය ක්‍රිඩාංගනයේදි පවත්වන ලද අතර, එහිදි මෙම ඒකකය නියෝජනය කරන ලද 57 වන සේනාංක ක්‍රිඩා කණ්ඩායම ශුරතාවය දිනාගන්නා ලදි.



### ශූරතා පලිහ මෙම බළඇණියට

එමෙන්ම ආසේමු(කිළි) ක්‍රිඩා තරගාවලියේ දි 57 සේනාංක ක්‍රිඩා කණ්ඩායම එහි ශුරතාවය හිමි කර ගැනිම වස් ලබා ගන්නා ලද ලකුණු ප්‍රමාණය 225 ක් වු අතර, එම ලකුණු ප්‍රමාණය ලබා ගැනිම සදහා මෙම ඒකකයේ ක්‍රිඩකයින් විසින් ලකුණු 197 ක දායකත්වයක් ලබා දි ඇත. එබැවින් තරගාවලියේ දක්ෂතම බළඇණියට හිමි ශුරතා පලිහ ආරක්ෂක සේනා මුලස්ථානය (කිළි) අණදාපති මේජර් ජෙනරල් ජිවී රවිප්‍රිය ඩබ්ඩබ්වි ආර්ඩබ්පි එන්ඩියු අයිජි යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සුරතින් මෙම ඒකකය වෙත පිරිනමන ලදි.




### දක්ෂතම ක්‍රීඩකයා මෙම ඒකකයෙන්

තවද සමස්ථ තරගාවලියේ දක්ෂතම ක්‍රිඩකයාට හිමි ශුරතාවය මෙම ඒකකය නියෝජනය කරමින් සහභාගිවු සෙ/15ඊ01100 කෝප්‍රල් හේරත් එච්එම්එන් විසින් ආරක්ෂක සේනා මුලස්ථානය(කිළි) ආඥාපති මේජර් ජෙනරල් ජිවී රවිප්‍රිය ඩබ්ඩබ්වි ආර්ඩබ්පි එන්ඩියු අයිජි යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සුරතින් හිමි කර ගනු ලැබිය.




## පිහිණුම් තරගාවලිය

### ශූරතාවය සහ දක්ෂතම ක්‍රීඩකයා මෙම ඒකකයෙන්

2019 වර්ෂයට අදාලව 11 (සෙව්) ශ්‍රිලංසිරෙ ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබු අන්තර් ඒකක පිහිනුම් තරගාවලිය 2019 දෙසැම්බර් මස 05 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි පවත්වන ලදි. එම තරගාවලිය සදහා 1,4,5,7,9,11,12 ශ්‍රිලංසිරෙ ඒකක සහ මෙම ඒකකයේ ක්‍රිඩකයින් සහභාගි වන ලද අතර, තරගාවලියේ ලකුණු 165 ක් ලබාගෙන මෙම ඒකකය ශුරතාවය හිමි කර ගන්නා ලදි.



තවද එම පිහිනුම් තරගාවලියේ දක්ෂතම ක්‍රිඩකයා ලෙස මෙම ඒකකය නියෝජනය කරමින් සහභාගිවු නි/10862 2/ලුතිනන් ජේඑම් ඒබ්‍රහම් යන නිලධාරි විසින් හිමි කර ගන්නා ලදි.

## 17 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





611 බළසේනාධිපති කදවුරු සංචාරය

2019.09.26 වන දින 611 බසේමු බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්බ්ඩ්එම් ආර්එස්පි අලුවිහාරේ ආර්ඩබ්පි ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් කදවුරු සංචාරය සිදුකල අතර එහිදී බලසේනාධිපතිතුමන් හට කදවුරු සම්මාන මුරයක් පිරිනැමීම සිදුකරන ලදි. අනතුරුව බලසේනාධිපති තුමන්ගේ කදවුරු සංචාරය සිහිවීම පිනිස පැල රෝපණයක් සිදුකර ඒකක නිළධාරින් හා සෙනින් සමග සමුහ ජායාරූපයකට පෙනී සිටින ලදි.



2019.12.01 වන දින මෙම ඒකක බලඇණි සංවත්සර දිනට සමගාමීව ජයශ්‍රීමහා බෝ සම්දුන් අභියස බෝධිපුජා පිංකමක් පවත්වා සදහිරු සැයේ ඉදිකිරීම් කටයුතු සදහා ශ්‍රම දායකත්වය ලබාදී ආශිර්වාද ලබා ගැනීම හා ඒකක අණදෙන නිලධාරි තුමන් හට කදවුරු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීමෙන් අනතුරුව අණදෙන නිලධාරි/උප අණදෙන නිළධාරි/රෙජිමේන්තු සැරයන් මෙජර් විසින් 12 වන සංවත්සර දිනය වෙනුවෙන් කේක් කපා අණදෙන නිලධාරිතුමා විසින් පැල රෝපණය සිදු කරන ලදි. ඉන් අනතුරුව සියළු නිළ දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි.



සදහිරු සැයේ ඉදිකිරීම් කටයුතු



අණදෙන නිළධාරි තුමා වෙත සම්මාන මුරයක්







ආසේමු වන්නි ආඥාපති තුමන්ගේ කදවුරු සංචාරය

2019.12.02 වන දින ආසේමු (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ කදවුරු සංචාරය සිහිවීම පිනිස පැල රෝපණය සිදුකිරීම හා අණදෙන නිලධාරිතුමා විසින් සමරු තිළිණයක් පිරිනැමීම සිදුකිරිමෙන් අනතුරුව ඒකක ඉදිරිපත් කිරීම අණදෙන නිලධාරිතුමන් විසින් සිදුකරන ලදි. ඉන්පසුව ආඥාපති තුමන් විසින් අමුත්තන් පැමිණිමේ පොතේ සටහන් තබන ලදි.



17 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

# නොමිනිසුන් අතර මිනිසෙකු වන්න

මිනිසා යනු කවරෙක්දැයි ඇසූ විට ඕනෑම පුද්ගලයෙකු පවසනුයේ “මනසින් උසස් පුද්ගලයා මිනිසා” බවයි. විශ්ව ලෝකයේ සතුන් අතරින්, ක්‍රමක්‍රමයෙන් පරිණාමයවී තිරිසන් ගතිවලින් ඈත්වී සදාචාර සම්පන්නව ජීවත්වීමට කල්යත්ම මිනිසාට හැකිවිය.

ක්ෂුද්‍ර ජීවියෙකුගෙන් හටගෙන ජලයේ සිට ගොඩබිම දක්වා ගමන්ගත් සත්වයෙක් වශයෙන් කල්යත්ම වානර මානවයෙක් බවටත්, එතැන් සිට අද දක්වා වූ විශාල කාල පරිඡේදයක් තුල පරිණාමයවූ මිනිසා දැනට ලෝකයේ සිටින සතුන් අතරින් ප්‍රභලතම හා බලවත්ම සත්වයා බවට පත්වී හමාරය.

තාක්ෂණය දියුණුවත් සමඟ මුළු ලෝක තලයම විශ්ව ගම්මානයක් බවට පත්වී ඇතත් වර්ථමානයේ බොහෝමයක් මිනිසුන්ගේ මිනිස් ගතිගුණ විශාල වශයෙන් පිරිහී තිරිසන් සතුන්ටත් වඩා ඉතා පහල මට්ටමකට ඇද වැටීම පැවතීම ඉතා කණගාටුදායක තත්වයකි. මෙවන් පරිසරයක් තුල ජීවත් වන අප ‘මිනිසුන්’ යැයි අප විසින්ම හන්වඩු ගසාගත්තද අප තුල මිනිස් ගතිගුණ කෙතෙක් දුරට වුවමනාව ඇත්දැයි විමසා බැලීමට කාලය එලඹ ඇත.

මුල් අවධියේදී තම මූලික අවශ්‍යතා පමණක් ඉටුකරගැනීමට ක්‍රියා කල මිනිසා කල්යත්ම තම ලියලන සුළු අශාවන් හා අසීමිත වුවමනාවන් සීමිත සම්පත් වලින් ඉටුකරගැනීමට උත්සහ කිරීමේදී ඇතිවන තරඟකාරීත්වය මත හටගන්නා අහිතකර තත්වය අද වනවිට මිනිසුන් අතර ගැටුම් ඇතිකරගැනීමට හේතු පාදක වී ඇත.

සියල්ල එසේ සිදුවන බැවින් අප මේ පිළිබඳ අවබෝධයෙන් යුතුව කරුණු කාරණා වටහාගෙන, තම පවුලටත්, සමාජයටත් සමස්ථ රටටත් වැඩදායක වන අයුරින් කටයුතු නොකළහොත් මතු පරම්පරාවට මිනිසුන් වශයෙන් ජීවත් වීමට පරිසරයක් නිර්මාණය නොවනු ඇත.

සමාජයේ පවතින කුඩාම ඒකකය වන්නේ පවුලයි. සදාචාරය, සභ්‍යත්වය හා සංස්කෘතිය යන කරුණු රඳා පවතින්නේ පවුලේ ක්‍රියාකාරීත්වය මතයි. එසේනම් පවුලක සාමාජිකයන් වශයෙන්, හෙට දින අපගේ වගකීම වියයුත්තේ රටට වැඩදායී සමාජයක් බිහිකිරීමට අවශ්‍ය පුද්ගලයෙකු පවුල තුලින් බිහිකිරීමයි.

එහෙත් පවුලක සාර්ථකත්වය රදාපවතින්නේ පවුල තුල සිටින සාමාජිකයන්ගේ, අධ්‍යාපන, ආර්ථික, අධ්‍යාත්මික ගුණ වගාව මෙන්ම සදාචාරාත්මක බව මතයි. තවද ගෘහ මූලිකයෙකු වශයෙන් පවුල තුල මෙම කාරණා ඉටුවන අයුරින් ක්‍රියාත්මක නොවීමට බලපාන තවත් ප්‍රධාන සාධකයක් වන්නේ, යතාර්ථය අවබෝධ කරගැනීමකින් තොරව තවත් කෙනෙකු අනුකරණය කිරීමට යෑමෙනි. මක්නිසාද අද ලෝකයේ විශාල වශයෙන් සිදුවන්නේ මිනිසුන් විසින් යතාර්ථයකින් තොරව අනෙකා සමග තරඟකිරීමට පෙළඹවීමයි.

මෙවන් තත්වයක් තුලදී අප විසින් තවදුරටත් වටහා ගතයුතු වන්නනේ අපගේ මූලික අවශ්‍යතා මොනවාද යන්න හා තම අවශ්‍යතාවයට අනුව ඒවා ගොඩනගාගැනීමට කටයුතු කලයුතු ආකාරයයි.

මෙහිදී තවත් වැදගත් කරුණක් වන්නේ ඉහත ආකාරයට ක්‍රියා කිරීමේදී අප විසින් තවත් පුද්ගලයෙකු, සතා සිව්පාවුන්ගේ මෙන්ම පරිසරයේ අවශ්‍යතාවයන් පිළිබඳව කොතෙක් දුරට සංවේදී වනවාද යන්නයි.

මෙම තත්වය තරමක් දුරට හෝ මැඩපවත්වාගෙන මිනිස්කම රැකගැනීමට නම් අප තනි පුද්ගලයෙකු වශයෙන් කටයුතු කලයුතුව ඇත. සොල්දාදුවන් වන අප හදවත් තුලද මෙවැනි මානුෂීය ගුණයන් වර්ධනය කරගැනීමට හැකියාවක් ඇත්නම් එය මුළු මහත් සමාජයටම පූර්වාදර්ශයක් වනවා නොඅනුමානය.

මිනිස් සත්වයා විසින් ජීවිතයේ යාතාර්ථය, තමා පිළිබදව, අවට පරිසරය හා සතා සිව්පාවුන් පිළිබඳව නිසි අවබෝධයක් ලබා ගන්නා තෙක් වර්තමාන ලෝකයේ පවතින ජාතිවාදී, ආගම්වාදී, කුලවාදී වශයෙන් හටගෙන ඇති බෝහෝ අරගලයන් සදහා විකල්ප විසදුම් හමු නොවෙනු ඇත. එසේ විකල්ප නොමැති කල මිනාසා විසින් නිරන්තරයෙන් අනෙකා සමඟ සටනට පෙළඹෙන අතරම දුබලයා මැඩගෙන ප්‍රබලයා ජයගනී.

එබැවින් අප විසින් කල යුත්තේ ලෝක ධර්මතාවය වටහාගෙන තනි පුද්ගලයෙකු වශයෙන් තමාට කළ හැකි සේවය නොපිරිහෙලා ඉටු කිරීමයි. ඒ සදහා ඉවහල් විය හැකි පහත සදහන් කරුනු කාරනා යෝජනා කරමි.

- හැකි සෑම අවස්ථාවකම සමාජීය සත්වයෙකු වීමට කටයුතු කරන්න.
- තමාගේ අධ්‍යාත්මික ගුණ වගාව දියුණු කර ගනිමින් තමාගේ දූ දරුවන්ගේද අධ්‍යාපනයට අමතරව අධ්‍යාත්මික ගුණ වගාව දියුණු කිරීමට කටයුතු කරන්න.
- මනස්කල්පිත වුත් ලියලන සුළුවුත් අසීමිත අශාවන් පාලනය කර ගන්න.
- ඔබ සුන්දරයැයි සිතන සෑම දෙයක්ම අනෙකාටද සෑම විටම සුන්දර නොවන බව වටහා ගන්නී
- තවත් කෙනෙකු විසින් සිදුකරනු ලබන සියල්ලම තමා විසින්ද අනිවාර්යෙන්ම සිදු කිරීමට අවශ්‍ය නොවන බව වටහා ගන්න.
- දුරකථනය භාවිතා කිරීමේදී අවශ්‍යතාවය හා තමා යෙදී සිටින රාජකාරිය කුමක්ද යන්න පිළිබදව කල්පනාකාරී වන්නී
- නිවසේදී, මගතොටදී හා රාජකාරී වේලාවන් වලදී මෙන්ම සෑම කලබලකාරී අවස්ථාවකදීම මුහුණ දිය හැකි අන්දමින් ඉවසීම ප්‍රගුණ කරන්න.
- ගැටලුකාරී අවස්ථාවක කරුණු කාරණා හරිහැටි අවබෝධ කරගන්නා තෙක් ඔබගේ කට නොඇර සිටීමට වගබලා ගන්න.
- තවත් ආගමක් විවේචනය නොකර තමන් අදහන ආගමෙහි ප්‍රතිපත්තීන් කොතෙක් දුරට තමා විසින් ක්‍රියාවට නංවන්නේද එය තමාගේ අධ්‍යාත්මයට කෙසේ බලපාන්නේද යන්න පිළිබදව සිතා බලන්න.
- අනුන්ගේ අඩුපාඩු වලට සිනා නොවී එය තමාට පාඩමක් කරගන්න.
- සම්පප්‍රලාප කියවීමෙන් වැළකී හැකි සෑම අවස්ථාවකම නිහඬව සිටින්න.



**මේජර් ආර්වී දිසානායක ආර්ඩබ්පී පීඑස්සී**
**විධායක අධිකාරී**
**රෙම ශ්‍රීලංසිරෙ**

# පැහැපත් අනාගතයකට ගුණදම් පිරි දරුවෙක් නිර්මාණය කරමු



කාලයාගේ ඇවෑමෙන් වෙනස්වන ලෙකය තුල සාරධර්ම හා සිරිත් විරිත් පදනම් කර ගනිමින් සිංහල සමාජය තුල වැඩි ආ සංස්කෘතිය අදවන විට වලපල්ලට යමින් පවති. එයට වග කිව යුත්තේ කවුරුන්ද කියා විමසිම ගොඩක් වටියි. අනාගතයේදි ශ්‍රිලංකිය සමාජයේ සලකුණක්ව පැවැති සදාචාරය හා අචාර ධර්ම වැනසි යාමේ සලකුණු පහලවී ඇති බැවිනි.

මිට වසර 2500 ට පෙර කොසෙල් රජු දුටු සිහින අදවන විට සැබැවී ඇති බැව් දක්නට ලැබේ. එයට ප්‍රධාන හේතුව නම් කුඩා කළ සිට දරුවන් වැරදි සඳහා යොමුවනු දක්නට ලැබෙන හේයිනි. ගමයි පන්සලයි වැවයි දාගැබයි යන සංකල්පයෙන් පෝශණය වුණු අපේ දරුවන් ලැජ්ජාව හා බය සමඟ හැදි වැඩුණී මෙ වන විට එම යුගය අතිතයට එකතුවී හමාරය.

අදවන විට දහම් පාසලට යාම සිමිත වුවද එදා දරුවන් දැනුමේන් හා සාරධර්මයන්ගෙන් පෝෂණය වුයේ දහම් පාසල තුලිනි. එයින් දරුවා ශිෂ්ට සම්පන්න දරුවෙකු බවට පත්වේ. වර්තමානය වන විට වසය අවුරුදු 18 පිරෙන්නට ප්‍රථම විවාහ වන දියණියන් ද අවුරුදු 13/14 වන විට ගැබ් ගන්නා දියණියන් පමණක් නොව කුඩා කල සිටම මත්ද්‍රව්‍ය භාවිතයට හුරුවු දරුවන්ද සමාජය තුල දක්නට ලැබිම කණගාටු දායකය. එයට හේතුව නොදන්නා සමාජ දහමට යොමුවු දරුවන්ගේ චර්යා රටවන් පිළිබදව කතා නොකරන බැවිනි.

කෙසේ හො දරුවන් ධර්මයට නොපෙළඹවිමේ ආදීනව ලෙස විශාල කරුණු රාශියක් ඇත දරුවෙකු පන්සලට යවන්නට භික්ෂුන් වහන්සේ නමක් ඇසුරු කරන්නට ධර්මය අවබෝධ කර ගැනිමට ඇති අවස්ථාද ඉතා අල්පය. සමහර අවස්ථාවල දී දෙමවුපියන් විසින් එයට බධා එල්ල කිරිම දක්නට ලැබේන අවස්ථාද ඇත.

මේ වන විට පාසල් දරුවන් දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතා කරන්නේද එවා පපයන් ලෙස නොදන්නා හෙයිනි. එපමනක් නොව දෙමව්පියන්ගෙන් ලබා ගන්නා මුදලින් ගණිකා නිවාස වල ගැහැණු සම්පයේ තෘප්තිය සොයන්නට යන්නේද ගුණ ගරුක බව නෙදන්නා හෙයිනි.

මේවැනි දැ තුලින් වර්තමාන සමාජය තුල කුඩා දරුවන් යහපත් මගට ගෙන එමට නම් අප තළ යුත්තේ කුඩා වියේ සිටම පුංචි දරුවාට දහම් පසල් හුරුකිරිමයි දරුවාගේ යම්යම් වැරදි වලට වැඩිපුර දෝෂාරෝපණය එන්නේ දෙමවුපියන්ටයි එම නිසා දෙමවුපිය වග කිම පිළිබදව මව් පියන් දැන සිටිය යුතුයි.

දහම් පාසලේ දහමට අනුව ගොඩනැගෙන දරුවා පව්වලට බියක් ඇති කර ගනියි වරදක් සිදු කිරිමට පෙර ඒ ගැන කල්පනා කාරි වෙයි තවද වැඩි හිටියන්ට ගරුකරන්නට වදින්නට නිසි සමාචාර දක්වන්නට දරුවෙකුට හොදින් ඉගැන්විය යුතුයි කුඩා කල සිටම දරුවා හැදෙන පරිසරය යහපත් විය යුතුයි එසේ වුවහොත් දරුවා අපරාධ කරුවෙකු හෝ මංකොල්ලා කාරයකු නොවි සමාජයට වැඩ දායි පුද්ගලයකු ලෙස කැපි පෙනෙනු ඇත දහමට දරුවා යොමු කිරිම දරුවාගේ සහ සමාජයේ අනාගත පැවැත්ම උදෙසා සිදුකරන උතුම් කටයුත්තකි.

**සෙ/367735 කොප්‍රල් නානායක්කාර එස්ආර්**
**1 ශ්‍රිලංසිරෙ**
**පුහුණු අංශය රෙම ශ්‍රිලංසිරෙ**

# නව අණදෙන නිලධාරී තනතුරු භාරගැනීම්

තනතුරු භාරගැනීම්




6 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිළධාරි
මේජර් බීආර් මුහම්දිරම් ආර්ඩබ්පි ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ
නිළධාරි 2019-12-26 වන දින රාජකාරී ආරම්භ කරන ලදි.



9 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිලධාරි
මේජර් එල්ජී ඈපා ආර්එස්පී යූඑස්පි
යන ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019-12-18 වන දින රාජකාරී ආරම්භ කරන ලදි.




12 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිළධාරි
මේජර් එච්ටී ද සිල්වා ආර්ඩබ්පි ආර්එස්පි යූඑස්පී පීඑස්සී
යන ජ්‍යෙෂ්ඨ නිළධාරි 2019-10-17 වන දින රාජකාරී ආරම්භ
කරන ලදි.



21 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිලධාරි
ලුතිනන් කර්නල් ජේඑම්ජේ පෙරේරා
යන ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019-02-04 වන දින රාජකාරී ආරම්භ කරන ලදි.

## පරිඝණක භාවිතය පිළිබඳ ඔබ නොදත් තතු කිහිපයක්



ඔබ pdf ගොනුවක් Download කලවිට එහි File Name එක .exe ලෙස අවසන් වේනම් එම ගොනුව Delete කරන්න මන්දයක් එය වෛරසයකි.

ඔබ youtube වීඩියෝවක් Download කරගැනීමට අවශ්‍යනම් www. සහ youtube. කොටස් දෙක අතර ss යොදන්න.

සෙ/381544 රසෙ අබේවික්‍රම පීජීයූපී
24 ශ්‍රීලංසිරෙ
පරිඝණක අංශය - රෙමශ්‍රීලංසිරෙ

# දෙවන අණදෙන නිලධාරී තනතුරු භාරගැනීම්




1 ශ්‍රීලංසිරෙ නව ඒකක
දෙවන අණදෙන නිලධාරි
මේජර් ටීකේජී මඩවල පීඑස්සී එල්එස්සී
යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019-11-06 වන දින
රාජකාරි භාරගන්නා ලදි.



21 ශ්‍රීලංසිරෙ නව ඒකක
දෙවන අණදෙන නිලධාරි
මේජර් එස්කේවීල්පීකේ සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී
ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019-04-20 වන දින රාජකාරි
භාරගන්නා ලදි.




23 ශ්‍රීලංසිරෙ ඒකක
දෙවන අණදෙන නිලධාරි
මේජර් එම්සීඑස් ජයසේකර ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019-11-29 දින
රාජකාරි භාරගන්නා ලදි.



2 (සෙවි) ශ්‍රීලංසිරෙ නව ඒකක
දෙවන අණදෙන නිලධාරි
මේජර් ඒඑච්ටීඕඑස් තිලකරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019-10-25 වන දින
රාජකාරි භාරගන්නා ලදි.

# රෙජිමේන්තු තනතුරු භාරගැනීම්



23 ශ්‍රීලංසිරෙ නව
රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස 2019/12/18
බනි I යූජීඑන් නිල්සන් යූඑස්පී බලලත් නිළධාරි
වැඩ භාරගන්නා ලදී

# සිංහ කැටපත් පවුර



## ප්‍රාර්ථනා

සින්දුර් කථාවේ ප්‍රාර්ථනා වීමට
මට නොහැකිය
එසේ වීමට අවශ්‍යත් නැත
නමුත්,
ඒ ආදරයට ආදරයයෙන්
ආදරය කරමි....
ඔබත් මමත් අතර නොව
ඔහුත් මාත් අතර පමණයි
එවන් ආදර කථාවක්
ගොඩනැගිය හැක්කේ
අවසරයි....
නුඹෙන් වෙන්ව යන්නට
සදාකාලයටම....

සෙ/383153 රසෙ විමලදාස ඊපිඑස්කේ
7 ශ්‍රිලංසිරෙ

## මවක් වී ගිය නුඹට

මාවත් දිගේ ගිය හැටි මතකද?
ඔය දෑත් අල්ලාගෙන
ඔය ඔරහිස මත හිස තියාන
වරු ගණන් දුක කීවා මතකද?
නොපෙනි යන නුඹ දෙස
බලා හිදිමි මම අද
කදුලු සමග ඉතිරි වු
සුසුම ළග....

7 ශ්‍රිලංසිරෙ
සෙ/378996 ලාකෝ හපුතන්ත්‍රි එච්එල්පි

## අහස පාලු වී ඇයි අහස පාලු වී ඇයි

අහස අද තනියම පාළුවෙන්
ඇයි අහසට සඳ නාවේ
සඳ ඇයි තනියම තරු ඇයි
අහසට නාවේ
නොදනිම කදුලු බිදු වැටෙයි
මගේ දෑසින්
සිත හඩයි මේ රැයේ
තනිකමින් පාලුවෙන්....

සෙ/383130 රසෙ දිසානායක ඩිඑම්
7 ශ්‍රිලංසිරෙ

## හදමු තව පැටියෙක්

මං බැන්දෙ
යෝධියෙක්ව
රට රකින යෝධයෙකුට
පණ දෙන යකඩ ගැහැනියෙක්ව

පැටව් දෙන්නෙක්
හැදුවට පස්සෙ
වටකළා යාලුවෝ මාව
“මදෑ බං දෙන්නෙක්
දරුවො හැදිල්ලට
යට කළේ ජීවිතෙයේ
රජ කාලෙ බං”

හදමු තව පැටියෙක්
මගෙ යෝධි කියනකොට
ඇඳෙන් පනින්නද මං?

ඒ පාර දුවං ආවේ
යෝධිගෙ අම්මා
“ඔය ඇතිනේද දරුවෝ,
පරිස්සම් වෙන්න
දන්නේම නැද්ද උබලා,
වදනවා වගෙ නෙවෙයි
හදන එක අද කාලේ”

හදමු තව පැටියෙක්
මේ යෝදිට ඕනා
යෝධ පවුලක්
ඒ පාර දුවං ආවේ
මගේ අම්මා
“යෝදිට තියෙන ගායට
දරුවො හැදෙන වග
නිගමනය කරපු ඇය
වඳ සැත්කමක අදහස
තෑගි කළාය මට”

හදමු තව පැටියෙක්
උස්සන්න නම් මගෙ රට
යෝධ පැටව්මයි ඕනා

ඒ පාර දුවං ආවේ
මිඩ් වයිෆ් නෝනා
“ඔය තරම් මෝඩද
ඔය දෙන්නා ඇත්තට,
උපත් පාලනය ගැන
මදිද කියලා දුන්නා මම,
ගේ දොරවත් හරියකට
හදාගෙන නෑ නේද තවම”

පැටියෙක් කියන්නෙ
ග්‍රහලෝකයක්
විචිත්‍ර ග්‍රහෙලෝක
පහක විස්තරය
කුසේ වැඩෙන
අලුත්ම ග්‍රහලෝකයට
කියනකොට දැනෙන
විශාලත්වය ළඟ
අනුන්ගෙ ප්‍රතිවිරෝධ
විහිළුවකි ඇත්තටම

හදමු තව පැටියෙක්
දන්නවද ඔබ
අන්තිම වතාවෙ
ඒ වචන ටික කිව්වෙ
මම..........

සෙ/ 384190 රසෙ කල්හාර එන්ඕඑන්
16 ශ්‍රීලංසිරෙ

සිංහ කැටයක් සුවඳ

## සෙබළාගේ හදවත

රත්තරන්
තව ගොඩක් කල්
ඉන්න වෙනවා මට බලන්

නිවාඩුව ලැබෙනකම්
එක දිගට මාසයක්
සුසුම් හෙලමින් හදින්
ඉන්නම්කො මම ඉතින්

ඇවිත් නුඹ දින හතේන්
යනෙන විට සමු අරන්
කොහොම ඉන්නද තවත්
මගේ ඇස් පොඩි කරන්

ජීවිතේ නෑ තවත්
නුඹ නිසා හිස්තැනක්
ආව විට නුඹ ගෙදර
නැතේ මට තනිකමක්

රත්තරන් සතියකින්
ජීවිතේ මගෙ මල ගමක්
නෑනෙ මට සැනසුමක්
යනෙන විට නුඹ සමු අරන්

සෙ/383349 රසෙ බංඩාර කේජීටීවීම්වී
14 ශ්‍රිලංසිරෙ

## ඔබේ කුමරිය

හිතට එඹුනට හීන මැව්වට
සමා වුව මැන කුමරුනේ
විසල් මන්දිර එහිවු කුමරුන්
නැත අප හට හිමි වුණේ

සාපයක් ඒ පාර නොගිහින්
පරපුරෙන් නෙරපා හලේ
දුප්පතුන් වු අපේ අයටම
ආලේ පෑමට ගොස් අනේ

ඉතින් කුමරුනි හඩා කම් නැත
අදත් ඒ දේමයි වුනේ
සොයා ගනු මැන ඔබේ කුමරි
මිදෙනු පරපුරේ දොසෙනේ

සෙ/376452 රසෙ සේනානායක එස්එම්එස්එන්
14 ශ්‍රිලංසිරෙ

## හදවත

සුසුම් සලන හන්තානක
කදුළු ගලන මද්ධහනක
එක සුදු පැහැ මලක් ටවලා
නුඹ පිපුනිද මගේ ලොවට

ඈ ගියාලු මං දාලා
සුසුම් කදුළු රන්දාලා
හැර යන කදුලද සුසුමද
යන්න එපා මං දාලා

සෙ/376452 රසෙ සේනානායක එස්එම්එස්එන්
14 ශ්‍රිලංසිරෙ

## කදුළු

නුඹ ගිහින් දැන් ගොඩක් කල් මුත්
මගේ හිත තව නුඹව සොයනවා
අතීතයෙ මතකයන් අතරින්
ඔබේ රුව මගෙ සිතේ මැවෙනවා

ගිය තැනක ඔබ ගොඩක් සතුටින්
දිවිය ගෙවනව ඇතියි සිතනවා
මතක හදවත තුරුළු කරගෙන
මමත් ඉදහිට කදුළු සලනවා

සෙ/377577 ලාකෝ ගමගෙදර ජීඑච්එම්කේඑච්
14 ශ්‍රිලංසිරෙ

## මහළු සිතක වියෝව

පුද පුජා පඩුරු දෙවියන් වෙත පුදලා
වැද බීම වැටි පෙරලි අහසට යැදලා
ලද මොහොතින් දැව රක්ෂිත ගිණි තබලා
අද දෙවි බැල්ම නැහැ ඒ සිත් කල කිරීලා

සෙ/377781 ලාකෝ උක්වත්ත යුආර්ඒපි
12 ශ්‍රිලංසිරෙ

සිංහ කැටපත් පවුර

**මගේ ජීවිතය**



යනෙන මේ ගමනේ
ගෙවෙන මේ ජීවේ
කොතැනදෝ අපේ නවාතැන්පල
නොදන්නෙමි මෙමා
මගේ දෛවය
නොසිතූ අයුරින්
මා ලගට ගෙනවිත් තියා
ජීවිතේ නව පිටුව පෙරලා
යලි නොඑන්නට දුර ගියා

නැවත යලි මට යන්නට හැකිනම්
සොදුරු ඒ මගේ අතීතය දිහාවට
නැවත මා අත දිගු කර ඉල්ලමි
දෙන්න මට ඒ මිහිර අතීතය

සෙ/383971 රසෙ විමලරත්න ටිපිඩිපි
යුධ හමුදා කඳවුර බෙරගල, කෑගල්ල

**ළමා විය**

හිරු කන්දෙන් බැස යන්නට සැරසෙනවා
ලා රත් පැහැයෙන් මුළු
අහසම බැබලෙනවා
සීත සුළං ගොම්මන් අදුරෙම එනවා
කෙලි සෙල්ලම් තාමත් මට සිහිවෙනවා

වෙල් දෙනි වල දුව පැන අපි නැටූ ඒ කාලේ
වැලි බත් උයා කෙලි සෙල්ලම් කල කාලේ
ඇල දොල වලට පැන පීනා ගිය කාලේ
මතකෙට නැගේ තාමත් මට පොඩි කාලේ

8 ශ්‍රිලංසිරෙ

**යලි වඩිනු මැන බුදු හිමියනේ!!!**

අකම්පිත ලොවේ සදා සැනසුම කොයිබ වේදෝ
ලොවේ සැම තැන බැලූ බැලූ දෙස
නොමිනිස්කම් නම් බෝමයි
ගත්සිත් පෙලා දිවෙන තරගය
නෑ නිමක් නම් පෙනෙන මානෙක............

ගතේ දහය සිතේ තාපය නිවාලන්නට
ඇවැසි මෙහොතය
වඩිනු මැන යලි බුදු හිමියනේ........

සොබා දහමට නොවූ අවනත
ලොවේ කිසිවක් නෑ
අරුමෙකි මේ දැවෙන විශ්වය
කොයිබ යන නෙහිද මනුසත්
දහම් ගග ලෝ තුල මුදා හැර
මනුදමින් ලෝ සතප වන්නට
යලි වඩිනු මැන බුදු හිමියනේ..............



සෙ378337 ලාකෝ ලියනගේ පීඑම්ජේ
12 ශ්‍රිලංසිරෙ

සිදී වියලෙන දිය පොදක් නොව
ගලා බසිනා උල්පතක් වෙමු අපි
හැගුම මත ජීවිතය නොතබා

බුද්ධියේ තැන පහන් දල්වමු අපි
ඉඩක් නොතබමු කදුළු බිදකට
සිනා තවරමු රිදුම දෙන හදි

පරාජිත සුසුමක හඩක් නොව
දහස් සුවහස් ජය හඩක් වෙමු අපි

නැගී සිටිමු අපි අප වෙනුවෙන්
දිලී නැගෙන හිරු කිරණ ලෙසින්

නැගී සිටිමු යළි යළි දිරියෙන්
තබා ඇදෙමු හී සර විලසින් අපි

නැගී සිටිමු නිදහස වෙනුවෙන් අප - නැගී සිටිමු අප රට වෙනුවෙන්
නැගී සිටිමු දස්කම් වෙනුවෙන් අප - නැගී සිටිමු අපි අප වෙනුවෙන්

12 ශ්‍රිලංසිරෙ

# උපන්දින සුභ පැතුම්




ඉමේෂා ශාෂිනි 2019.11.24 දින පළමු උපන්දිනය සැමරූ සිය ආදරණීය සුරතල් සිගිති දියණියට නිදුක්නිරොගි වසනාවන්ත යහපත් අනාගතයකට හදපිරි සෙනෙහසින් යුතුව ආසිරි පතන්නේ පියා සෙ/376259 ලාකෝ තිලකරත්න ඒම්ඩීපීඒ හා මව පී ශෂිකා මධුශානි.



හර්ෂිකා නෙත්සරණි ක්‍රිෂාන්ජලි 2019.12.18 දින නමල් අන්ද තක්ෂිලා පෙර පාසලේ වාර්ෂික විවධත් ප්‍රසංගය පවත්වන ලද අතර ඒම ආදරණීය සුරතල් සිගිති දියණියට නිදුක්නිරොගි වසනාවන්ත යහපත් අනාගතයකට හදපිරි සෙනෙහසින් යුතුව ආසිරි පතන්නේ පියා සෙ/369741 කෝප්‍රල් සම්පත් කුමාර ඩීසී ආර්ඒස්පි.




2019 දෙසැම්බර් මස 26 දින අටවන උපන් දිනය සමරන කේ.ඩි ඉසුරු උදයංග තත්සරණ පුතුනුවන් හට සුබ උපන් දිනයකට පැතුම් ගෙන එන්නේ ආදරණීය අම්මා සමගින් තාත්තා සෙ/372575 කෝප්‍රල් සුරනිමල කේ.ඩි- 23 ශ්‍රිලංසිරෙ



2019 ඔක්තෝබර් මස 08 දින දෙවන උපන් දිනය සමරන ඉමේෂ් ඉදුවර කුමාරසිරි පුතුනුවන් හට සුබ උපන් දිනයකට පැතුම් ගෙන එන්නේ ආදරණීය අම්මා සමගින් තාත්තා සෙ/377695 ලාකෝ කුමාරසිරි ඒට්එච්ඒ 23 ශ්‍රිලංසිරෙ



2019 දෙසැම්බර් මස 25 දින හත් වන උපන් දිනය සමරන කේජී සුවස්නා ෂෙනාදි දියනිල්ල දියණියට සුබ උපන් දිනයකට පැතුම් ගෙන එන්නේ ආදරණීය අම්මා සමගින් තාත්තා සෙ/370366 ලාකෝ මනෝජ් කුමාර කේජිඑම් ආර්එස්පි 23 ශ්‍රිලංසිරෙ



ජිඑම් නතිදු නිසංකර අමරසූරිය 2019 දෙසැම්බර් මස 25 දින හය වන උපන් දිනය සැමරූ සිය ආදරණීය පුතනුවන් හට නිදුක් නිරෝගි වාසනාවන්ත යහපත් අනාගතයකට හදපිරි සෙනෙහසින් යුතුව ආසිරි පතන ආදරණීය අම්මා සමගින් තාත්තා (සෙ/380629 කෝප්‍රල් අමරසූරිය ජිඑම් ආර්එස්පි 9 ශ්‍රිලංසිරෙ)

# සුභ මංගලම්....

යුගදිවියට සුභ පැතුම්



2019-10-19 වන දින 23 ශ්‍රීලංසිරෙ ඒකකයේ සෙ/375951 ලාකෝ මිහිරාජ් කේඩබ්ටිසි සහ එච්ඩී හෂිනි යන අය සමග යුග දිවි ගමන අරඹන ලදි



2019-12-05 වන දින 23 ශ්‍රීලංසිරෙ ඒකකයෙ අයත් සෙ/381797 ලාකෝ පද්ම කුමාර පිජීපි සහ ඩබ්ටිපි දේවරත්න යන අය සමග යුග දිවි ගමන අරඹන ලදි



2019.10.25 වන දින 6 ශ්‍රීලංසිරෙ ඒකකයේ සෙ/381615 කෝප්‍රල් ප්‍රියමාල් එච්ඒඑම්ඕ සහ කේටී නවමලි යන අය සමග යුග දිවි ගමන අරඹන ලදි



2019.08.08 වන දින 5 (සෙවි)ශ්‍රීලංසිරෙ ඒකකයේ සෙ/ඊ100934 රසෙ පතිරණ අයිවී සහ ඒවයි දීෂා උදයාන්ගනී යන අය සමග යුග දිවි ගමන අරඹන ලදි

# විදේශිය පාඨමාලා ජය ලබා....












**2019.10.21 දින සිට 2019.12.21 දින දක්වා ඉන්දියාවේ පවත්වන ලද බණ්ඩ අණදෙන්නන්ගේ පාඨමාලාව - 267 සඳහා සහභාගී වන ලද 8 ශ්‍රීලංසිරෙ ඒකකයට අයත් සෙ/368593 ඔනි 11 තිලකරත්න ඩබ්ජ්එස්කේ බලලත් නිළධාරි සමස්ථ පාඨමාලාවේ හොදම විදේශිය සෙබලාට හිමි සම්මානය දිනා ගන්නා ලදි.**

**අදාල පාඨමාලාව ඉන්දියාවේ බෙල්ගම්හි බණ්ඩ අණදෙන්න්ගේ පුහුණු අංශයෙහි පවත්වන ලද අතර, පාඨමාලාව සඳහා ශ්‍රී ලංකාව, භූතානය, නයිජිරියාව හා මොරිෂස් රාජ්‍යය යන හමුදාවන්වල සාමාජිකයින් 28 දෙනෙකු සහාභාගී වි ඇත. ඔවුන් අතරින් හොදම විදේශිය සෙබලාට හිමි සම්මානය හා සහතික පත්‍රය එම පුහුණු පාසලෙහි සේනාවිධායක සුරතින් ලබා ගන්නා ලදි.**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



**උපදේශකත්වය**

බ්‍රිගේඩියර් ඩී පී පල්ලාවෙල ආර්ඩබ්පි ආර්එස්පි



**ප්‍රධාන සංස්කාරක**

මේජර් ආර්වි දිසානායක ආර්ඩබ්පි පිඑස්සි



**සහය සංස්කාරක**

මේජර් එච්චිල්කේ සංජීව ආර්එස්පි



**සෝදුපත් කියවීම**

මේජර් ජේඑම්පිකේ ජයසුන්දර

**පරිගණක අකුරු**
**සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**



රසෙ අබේවික්‍රම පීජියුපී
24 ශ්‍රිලංසිරෙ



රසෙ කුමාර පීජීඩීජේඑස්
6 ශ්‍රිලංසිරෙ

**මුද්‍රණය**

ප්‍රකාශණ අංශය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය

**ලිපිනය**

රෙජිමේන්තු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
යුද්ධ හමුදා කඳවුර,
අඹේපුස්ස

**ඊමේල්**

rhqslsr@army.lk/rhqslsr@gmail.com

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට වේල්ස් කුමරියේ ප්‍රණාමය............

නිර්භීතවද වේගවත්ද
ගගන පෑයු රන් සඳක් සේද
දියත කැළඹවාවූ මහා රළ පෙලක් සේද
ඔබ අපට හෝරා කිහිපයක් තුළ
ලොව දිනන මග කියා දුන්නේය.
ලොවක් හෙලිකළාවූද
ඔබ මහා විරු සඳකි...............
එදින අප හද තුළට පිවිසුණු මතකයන්............
මියෙනා තුරු අප හදවත් අතැර නොයනු ඇත.
අප ඔබ මෙසේ තුති පුදන්නේද.
හදවත් වලට සැබෑ ධෛර්යමත් හා
වෙනස් වූ අත්දැකීමක් දුන් නිසාවෙනි.
එදින ඔබ දැරූ මහා වීරිය එලදරා
අප ලකඹර රකින දිනයක
හැකියි ඔබට සැනසෙන්න
ලක් මවට දුන් දායාද ගැන.
කිසිදා අමතක නොවන
සොදුරු මතකයක් අපට දුන්
ඔබට............

ශිෂ්‍ය නායිකා සංසදය - 2019
වේල්ස් කුමරි විද්‍යාලය මොරටුව